# 13 ශ්‍රේණිය - 7වන පාඩම සම්පූර්ණයෙන්ම

## 7.1 නිර්මාණාත්මක සන්නිවේදනයේ ස්වභාවය අවශ්‍යතාවය හා වැදගත්කම.

### හැදින්වීම

නිර්මාණාත්මක සන්නිවේදනයේ දී සිදු කෙරෙන්නේ සාහිත්‍ය, කවිය, ගීතය නිසදැස් ආදී විවිධ කලාවන් උපයෝගී කොටගෙන යමක් ප්‍රකාශ කිරීමයි. මෙය තවදුරටත් පැහැදිළි කලහොත් නිර්මාණාත්මක සන්නිවේදනයෙහි සරල අර්ථය වන්නේ කිසියම් සන්දේශයක් ග්‍රාහකයාට වඩාත් සමීපව වැටහෙන ලෙස ප්‍රකාශ කිරීමයි. මෙය අවස්ථාවෙන් අවස්ථාවට අරමුණෙන් අරමුණට වෙනස් විය හැකිය. එමෙන්ම නිර්මාණාත්මක සන්නිවේදනය නිර්මාණාත්මකව සිතීමකට ඉඩලබා දීමයි.

නිර්මාණාත්මක සන්නිවේදනයේ ආරම්භය මානව ශිෂ්ටාචාරයේ ආරම්භය දක්වා ඈතට දිවයයි.

අතීත මානවයා දඩයම පිණිස කැලයට ගිය විට මුහුණ දුන් අත්දැකීම් තම සමූහය ඉදිරියේ අනුකරනය කර පෙන්වීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් රංගනය බිහිවිය. තමා දුටු දේ අන් අයට පෙන්වීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් චිත්‍ර කලාව බිහිවිය. තමා අත්විදි දේ සෙසු අය ඉදිරියේ ප්‍රතිනිර්මාණය කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණාත්මක සන්නිවේදනය බිහිවිය.

නිර්මාණාත්මක සන්නිවේදනයේ මූලික ලක්ෂණයක් නම් පුද්ගලයා ලත් අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමයි. එමෙන්ම මෙහිදී අදහස්, හැඟීම්, ප්‍රකාශ කිරීම සිදු කරන්නේ ව්‍යංගයනි. මෙයට නිදසුන් ලෙස ජනකථා, ජනකවි දැක්විය හැකිය.

මෙහිදී නිර්මාණාත්මක සන්නිවේදන මාධ්‍ය පිළිබඳව විමසීම වැදගත් වේ. කවි, කෙටිකථා, නවකථා, චිත්‍ර, කාටුන්, ඡායාරූප, වෙළඳ දැන්වීම්, ගීත, වේදිකා නාට්‍ය දැක්විය හැකිය. නිර්මාණාත්මක සන්නිවේදනය ග්‍රාහකයා තුළ ආකර්ශනයක් ඇති වන ආකාරයෙන් සන්නිවේදනයේ යෙදෙයි.

ලෝකයේ වර්ධනය හා තාක්ෂණික මාධ්‍යවල නැගීමත් සමගම සම්ප්‍රදායික සමාජයේ පැවැති කලා ප්‍රවර්ග වන ජන ශ්‍රැතිය, ජන සංගීතය, ජන වහර වෙනුවට දෘශ්‍ය කලා ක්‍රම වන රූපවාහිනිය, ගුවන්විදුලිය, නවකථා, කෙටිකථා ආදිය බිහිවිය. මෙම එක් එක් නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රමවල සුවිශේෂිතා හඳුනාගත හැකිය.

මෙහිදී නිර්මාණය යන්න පිළිබඳව ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ සඳහන් විග්‍රහය පිළිබඳව විමසීම වැදගත් වේ.

Udaya Amaraweera
BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
University Visiting Lecturer,
0711715342

යම් නිමැවුමක් සඳහා පරිකල්පනය හෝ අපූර්ව අදහසක් හෝ භාවිත කිරීම නිර්මාණශීලිත්වයයි.

නිර්මාණශීලිත්වය මනස සමග උප්නැංවෙන සාධකයකි. කලාව කලාව වර්ධනය වීම සඳහා නිර්මාණශීලිත්වය වැදගත්වේ. මෙහිදී කලාව පිළිබඳව ලියෝ ටොල්ස්ටෝයි නිර්වචනය කර ඇති ආකාරය විමසීම වැදගත් වේ.

යමෙකු යම් වේදිතයයක් විඳගැනිමෙන් පසු චලන රේඛා වර්ණ ශබ්ද හෝ චලන සංයෝග මගින් ඒ වේදිතය ඒ අයුරින්ම අන්‍යයන් තුළ දැනවීම කලාවයි.

වර්තමානයේ දී විවිධ සන්දේශ නිර්මාණාත්මකව ග්‍රාහකගත කෙරේ. යම් සන්දේශයක් නිර්මාණාත්මකව ග්‍රාහගත කිරීම සඳහා විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවල වර්ධනයත් තාක්ෂණය දියුනු වීමත් ඉවහල් විය. නිර්මාණාත්මක සන්නිවේදනය පිළිබඳව විමසීමේ දී මේ පිළිබඳ අදහස් දක්වන ලද විද්වතෙකි මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර එතුමා සිය නිර්මාණාත්මක සන්නිවේදනය නැමැති කෘතියේ මෙලෙස නිර්මාණාත්මක සන්නිවේදනය විස්තර කර තිබේ.

වඩාත් යහපත් ප්‍රතිචාර ලබා ගැනිම යනු මාධ්‍ය භාවිතයෙහි අර්ථ සිද්ධියක් ලෙස සැලකිය හැකිය. මේ සංකල්පය සන්නිවේදනයේ දී පළමු කොට හඳුනා ගත්තේ කිසියම් සමාජීක අවශ්‍යතාවයක් මුදුන් පමුණුවා ගැනීමක් වශයෙනි. දෙවනුව ඒ අවශ්‍යතාවයේ මහිමය කෙමෙන් අන්‍යොයන්ට ද වටහා ගැනීමට හැකිවනු නිසැකය. මේ නිර්මාණාත්මක රීතිය සන්නිවේදන අධ්‍යයනයේ දී සාර සන්නිවේදනය(**Effective Communication**) හෙවත් නිර්මාණාත්මක සන්නිවේදනය(**Creative Communication**) නමින් හැඳින් වේ. ඒ සඳහා කිනම් බසකින් ලිව්වත් කිනම් බසකින් ඇමතුවත් කවරාකාර සමාජයක විසුවත් එහි විශ්ව සාධාරණ ගුණයක් ඇතැයි සැලැකේ.

නිර්මාණශිලිත්වය සහ නිර්මාණශිලි සන්නිවේදනය පිළිබඳව විශලේෂණය කිරීමේ දී මෙම අංග දෙක අතර අවියෝජනීය සබඳතාවයක් පවතින බව ගම්‍ය වේ. යම් සන්දේශයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කරන තරමට ඒ කරා සිදුවන ආකර්ශනය ද ඉහල මට්ටමක පවතී. එමනිසා සන්නිවේදකයා ග්‍රාහකයා තුළින් අපේක්ෂා කරන පෙලඹවීම් උපරිම මට්ටමෙන් සිදුවීම සඳහා නිර්මාණශීලීව සන්දේශ ඉදිරිපත් කිරීම වැදගත් වේ.

නිර්මාණශිලිත්වය සහ සන්නිවේදනය අතර අතීතයේ සිටම අවියෝජනීය සබඳතාවයක් පැවැතුන අතර එය පහත පරිදි විස්තර කළ හැකිය.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

අතීතයේ විසූ මානවයා සන්නිවේදනය කිරීම සඳහා විවිධ ශිල්ප ක්‍රම භාවිතා කලේය. නිදසුනක් ලෙස රේඛා රූප චිත්‍ර දැක්විය හැකිය. මේවා මානව පරිනාමයත් සමගම කලාක්‍රම බවට පත්විය. උදා චිත්‍ර කලාව, නැටුම් කලාව.

විවිධ සමාජ වල නිර්මාණාත්මක සන්නිවේදන කාර්යයන් වල නියලෙන විශිෂ්ටයන් ඇත. (නිදසුනක් ලෙස ලියනාඩෝ ඩාවින්චි - චිත්‍ර ශිල්පය, විලියම් ශේක්පියර් - සාහිත්‍ය, බිතෝවන් - සංගිතය, වැනි විද්වතුන් ගත හැකිය). ඔවුන් චිත්‍ර කලාව, සාහිත්‍ය සංගීතය ආදී ක්ෂේත්‍ර පෝෂණය කළෝය. ඒවා එකල සමාජයේ ජීවත්වුනු පුද්ගලයන්ගේ නිර්මාණශීලී චින්තනය වර්ධනය කළේය.

වර්තමානයේ දී සියලුම සන්නිවේදන මාධ්‍ය එනම් පුවත්පත් රූපවාහිනිය ගුවන්විදුලිය අන්තර්ජාලය වැනි මාධ්‍ය නිර්මාණශීලිව සිය සන්දේශ විකාශනය කරයි.  මෙය සාර සන්නිවේදනයක් ගොඩ නැගීමට උපකාරී වේ.

## නිර්මාණාත්මක සන්නිවේදනයේ ස්වභාවය.

පුද්ගල ජීවිතයේ සිදු කරන සෑම ක්‍රියාකාරකමක් තුලම නිර්මාණශිලිත්වය අන්තර්ලතවී තිබේ. පුද්ගලයා දෛනික ජීවිතයේ දී පවසන වදන් සිදු කරන අභිනයන් තුළ නිර්මාණශලිත්වය පවතී.  එමෙන්ම සමස්ත විශ්වයේ සියලුම ක්‍රියාකාරකම් තුලම යම් අපූර්වත්වයක් නොවසේ නම් නිර්මාණශිලිත්වයක් අන්තර්ගතව පවතින බව පැහැදිලි වේ. එමෙන්ම සෑම පුද්ගලයකු තුලම සුවිශේෂි කුසලතා පවතී.  මේවා ඔප් නැංවීමට නිර්මාණශිලි චින්තනය ඉවහල් වේ. ලෝකයේ විශිෂ්ට චිත්‍ර ශිල්පින් විද්‍යාඥයින් සාහිත්‍යධරයන් බිහිවීම සිදුවුයේ ඔවුන් තුල පැවැති සුවිශේෂි නිර්මාණශිලි චින්තනය හේතුවෙනි. පුද්ගලයකු පරිසරය සහ සමාජය සමග පවත්වන සබඳතා වලින් ලබා ගන්නා අත්දැකීම් නිර්මාණශිලිත්වය වර්ධනය වීමට ඉවහල්වේ.

නවෝත්පාදනය නොවසේනම් ලෝකයට නව නිර්මාණ බිහිකිරීම සිදු වන්නේ නිර්මාණාත්මක සන්නිවේදනය මගිනි. ලෝකයේ බිහිවු විශිෂ්ට විද්‍යාඥයින් සාහිත්‍යධරයන් නිර්මාණශිලි චින්තනය පරිකල්පනය ලොවට නව නිපයුම් බිහිකිරිමට මාවත සකස් කළේය. එමනිසා නවෝත්පාදනය නොවසේනම් නව නිර්මාණ බිහිකිරීම නිර්මාණශිලි සන්නිවේදනයේ මූලික ස්වභාවයක් වශයෙන් හැදන්විය හැකිය.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

නිර්මාණාත්මක නවෝත්පාදන සන්නිවේදනය මෙහිදී වැදගත්වේ. මෙයින් අදහස් වන්නේ පුද්ගලයකුගේ පරිකල්පනය චින්තනය ස්මරණය මුවහත් කොට එතුලින් නව කලාකෘති සාහිත්‍යකෘති, නිෂ්පාදන ලොවට බිහිකිරීමයි. මෙම නිර්මාණශීලි නවෝත්පාදන සන්නිවේදන ශක්‍යතාවය වර්ධනය කර ගැනීම සඳහා නිපුනතාකරා මෙහෙයවීම, අධිෂ්ඨානශිලි පරිකල්පන හැකියාව ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කර ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීම වැදගත් වේ.

පොතපත පරිශීලනයෙන් පෙර නිර්මාණකරුවන්ගේ කෘති ඇසුරු කිරීමෙන් අභ්‍යාසයේ යෙදීමෙන් පුද්ගලයකු තුළ නිපුණතාවය නොවසේනම් කුසලතාවය වර්ධනය කර ගත හැකිය.

තමා ඉගෙනගත් දෙය දන්නා දෙය තව තවත් වර්ධනය කර ගන්නා ආකාරය පිළිබඳව නිතර මෙනෙහි කිරීම තුළින් පුද්ගලයකු තුළ අධිෂ්ඨානශිලි පරිකල්පන ශක්‍යතාවය වර්ධනය කර ගත හැකිය.

තමා බාහිර පරිසරයෙන් ලබාගත් දැනුමට තමන්ගේ පරිකල්පන හැකියාව එකතු කර ගනිමින් විවිධ නිර්මාණ අත්හදා බැලීම ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය වශයෙන් හැඳින්විය හැකිය.

නිර්මාණාත්මක සන්නිවේදනයේ ආරම්භය ඉතා ඈතට දිවයයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජිවත් වූ මානවයින් තමාගේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනිම සඳහා එනම් ආහාර සොයා ගැනිම, ආරක්ෂාව සලසා ගැනිම, තම වර්ගයා බෝකර ගැනිම යන ආදි අවශ්‍යතා ඉටුකර ගැනිමට විවිධ ක්‍රියාකාරකම් වල යෙදුනි. මෙම ක්‍රියාකාරකම් ඉන්ද්‍රිය බද්ධ වූ හා පරිසර බද්ධ වූ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වශයෙන් හැඳින්විය හැකිය. තමා මෙම කාර්යයන් සිදු කිරිමේ දි ලත් අද්දැකිම් අන්‍යයන් සමග බෙදාහදා ගැනීමට අභිනය සිරුරු බස සංඥා ආදිය භාවිතා කළේය. මෙය නිර්මාණාත්මක සන්නිවේදනයේ මූලික අවධියයි.

ක්‍රමයෙන් මානවයා වනාන්තර ජීවිතයෙන් මිදී ජනාවාස ගතවීමත් සමග ඔහුගේ සන්නිවේදන හැකියාව ද වර්ධනය විය. මෙහිදී මානවයා සන්නිවේදනය සඳහා විවිධ භාණ්ඩ නිෂ්පාදනය කර ගන්නා ලදී. නිදසුනක් ලෙස බෙරය නලාව දැක්විය හැකිය. එමෙන්ම විවිධ අභිචාර ක්‍රමවේද ද සොයා ගන්නා ලදී. විශේෂයෙන්ම ලෙඩ රෝග වලින් ආරක්ෂා වීමට අදෘශ්‍යමාන බලවේග වල පිහිට ලබා ගැනීමට පුද පූජා නර්තන රටාවන් සොයා ගන්නා ලදී. මෙම ක්‍රමවේද ක්‍රමයෙන් නර්තනය ගායනය වාදනය ලෙස වර්ධනය විය. මානවයා ක්‍රමික පරිනාමයත් සමගම ඔහු විසින් භාවිත කරන ලද ඉහත සඳහන් කරන ලද අභිනයන් චාරිත්‍ර වාරිත්‍ර ආදි ක්‍රමවේද ක්‍රමයෙන් වර්ධනය විය.

විශේෂයෙන්ම **14 -17** යන මධ්‍ය කාලින යුගවලදී අධ්‍යාපනික ක්‍රමවේද වල වර්ධනය මානව චින්තනයේ වර්ධනයත් සමගම මානවයාගේ නිර්මාණශිලිත්වය තවත් වර්ධනය විය.

මානව ශිෂ්ටාචාරයේ වර්ධනය වීම සඳහා නිර්මාණශිලි සන්නිවේදන ක්‍රම ඉවහල් විය. විශේෂයෙන්ම යුරෝපයේ කාර්මික විප්ලවයෙන් පසුව ක්‍රමයෙන් විවිධ මාධ්‍ය බිහිවිය. මෙහිලා පුවත්පත ගුවන්විදුලිය, රූපවාහිනිය, සිනමාව වැදගත් වේ. මෙම මාධ්‍ය තමන්ගේ ග්‍රාහක ක්ෂේත්‍ර වර්ධනය කර ගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කළේය. එමෙන්ම මාධ්‍ය අතර ඇති වූ තරගය නිසා එක් එක් ජනමාධ්‍ය වර්ග එකිනෙකට වෙනස් නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රම භාවිතා කළේය. පුවත්පත් දිප්තිමත් වර්ණ යොදා ගෙන ශීර්ෂ පාඨ පල කිරිම, සරල භාෂා රිතියක් භාවිතා කිරිම, ගුවන් විදුලිය සියුම් නාදරටා බහුලව භාවිතා කිරිම රූපවාහිනිය විවිධ කැමරා කෝණ දිප්තිමත් වර්ණ භාවිතා කිරීම දැක්විය හැකිය. මේවා පරිශීලනය කිරිම තුළින් පුද්ගලයන්ගේ ජීවිත වලට නිර්මාණශීලී සන්නිවේදන ක්‍රම බද්ද විය. වර්තමානයේ දී පුද්ගලයන් තමන් වහරන භාෂාවට ජනමාධ්‍ය මගින් ලබා දෙන විවිධ වදන් භාවිතා කරයි.

## නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාවය හා වැදගත්කම.

නිර්මාණාත්මක සන්නිවේදනයේ ආරම්භය ඉතා ඈත අතීතය දක්වා දිය යන බව අපි දනිමු. අතීතයේ විසූ මානවයා භාවිතා කරන ලද නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රමවේද වශයෙන් පුරාණෝක්ති ජනගායනා ජන ඇදහිලි ජනකවි ජන ක්‍රිඩා යාතු කර්ම ජනරංග කලා ජන ආගම් දැක්විය හැකිය. සමාජය නුතන යුගයට අවතීරන වීමත් සමගම පුද්ගලයාගේ නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රමවේද වෙනස් විය. නුතන යුගයේ නිර්මාණාත්මක සන්නිවේදන මාධ්‍ය වශයෙන් මුද්‍රිත මාධ්‍ය වේදිකාව සිනමාව ගුවන් විදුලිය රූපවාහිනිය දැක්විය හැකිය. ඉහත දක්වන ලද කවර නිර්මාණාත්මක සන්නිවේදන වර්ගයකින්ම අපේක්ෂා කරන්නේ ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනීමයි.

මෙහිදී නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාවය සහ වැදගත්කම පහත ලෙස දැක්විය හැකිය.

- නුතන මිනිසාට සිය දෛනික ජිවිතය සහ වෘත්තීය ජිවිතය ශක්තිමත් කර ගැනීමට හා ප්‍රබෝධමත් කර ගැනීමට නිර්මාණාත්මක සන්නිවේදනය වැදගත්වේ.

වර්තමානයේ දී මිනිසා අවිවේකී ජිවිතයක් ගත කරයි. එමෙන්ම දෛනික ජිවිතයේ දී විවිධ පුද්ගලයන් සමග වෘත්තිකයන් සමග කටයුතු කරයි. එමෙන්ම පෞද්ගලික සහ වෘත්තීය

අභිමථාර්ත සාධනය කර ගැනිමට මනා සමාජ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. මෙම සියලු කාර්යයන් සඳහා නිර්මාණාත්මකව පුද්ගලාන්තර කණ්ඩායම් සමූහ සන්නිවේදනයේ යෙදිම වැදගත්වේ.

- සතුට සැහැල්ලුව අධ්‍යාත්මික ප්‍රබෝධය හා චිකිත්සාව වැනි මානව වුවමනාවන් ඉටුකර ගැනීම සහ පෝෂණය කර ගැනීමට නිර්මාණාත්මක සන්නිවේදනය වැදගත්වේ.

පුද්ගලයා වෙහෙසට පත්වූ විටකදී මානසික ගැටලුවකට මුහුණදුන් විටකදී විනෝදය අධ්‍යාත්මික ප්‍රබෝධය කරා යොමුවේ. මෙහිදී පුද්ගලයා සතුට ලබා ගැනීම සඳහා රසවිදින සංගිතය නරඹන නාට්‍ය වඩාත් ආකර්ෂණිය විමට එය නිර්මාණාත්මක ප්‍රවේශයකින් ඉදිරිපත් කිරිම වැදගත්වේ. අධ්‍යාත්මික සුවතාවය සඳහා යාඥා කිරිම, ශ්ලෝක ගායනා කිරිම වැනි අවස්ථාවලදි ඒවා විවිධ ශබ්දරටා භාවිතා කරමින් නිර්මාණාත්මක ඉදිරිපත් කිරිම වැදගත්වේ.

- නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රියාකාරකම්වල නිරත විමෙන් සංකිර්ණ සහ අවිවේකි වත්මන් මානව ස්වභාවය ජයගත හැකිවේ.

අවිවේකිව කටයුතු කරන පුද්ගලයාට තම දෛනික කටයුතු කරන අතරතුර මිහිරි සංගිතයකට සවන් දිමෙන් වෙහෙස විඩාව මගහැරේ. එමෙන්ම මානසික ගැටලුවකට මුහුණදුන් විට තම ගැටලුව කවියකින් නිසැදැසකින් ප්‍රකාශ කිරිමෙන් සැහැල්ලුව ඇතිවේ.

- ගැඹුරු සංකල්ප දර්ශනවාද පහසුවෙන් අවශෝෂණය කර ගැනිමට විවිධ විකල්ප දැනුම් හඳුනා ගෙන ජීවිතයේ මධ්‍යස්ථභාවය හඳුනාගැනිමටත් නිර්මාණාත්මක සන්නිවේදනය වැදගත්වේ.

විවිධ විද්වතුන්ට දේශකයන්ට දාර්ශනිකයන්ට සිය දේශන දාර්ශනික මතවාද සමාජගත කිරිමේ දි නිර්මාණාත්මක සන්නිවේදනය භාවිතා කල හැකිය. දේශනවල කරුණු ප්‍රස්තාර රූප සටහන් මගින් ඉදිරිපත් කිරිමෙන් පහසුවෙන් තේරුම්ගත හැකිය. විද්වත් අදහස් උපමා රූපක මගින් ඉදිරිපත් කිරිම වැදගත්වේ.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

- විෂයානුබද්ධව අන්තර්වර්තී පුද්ගලාන්තර සමූහ ජන සහ අතථ්‍ය සන්නිවේදන ක්ෂේත්‍රවල ප්‍රබල සන්නිවේදකයකු වීමට නිර්මාණාත්මක සන්නිවේදනය වැදගත්වේ.

පුද්ගලයා සමාජයේ විවිධ පුද්ගලයන් සමග සබදතාවයන් පැවැත්වීමේ දී ඉහත සදහන් කරන ලද සන්නිවේදන වර්ග භාවිතා කරයි. මෙම සන්නිවේදන ක්‍රම මනාව භාවිතා කිරිම සදහාත් ඒවායින් පහසුවෙන් ග්‍රාහකයන් ආකර්ෂණය කර ගැනිම සදහාත් නිර්මාණාත්මක බව වැදගත්වේ. එනම් සන්නිවේදනයේ දී උචිත පරිදි භාෂා රටා යොදා ගැනිම බඩ පාලනය ලිඛිත අලිඛිත බව ශරිර භාෂාව භාවිතා කිරිම වැදගත්වේ.

- අධ්‍යාපනය විනෝදය තොරතුරු සහ පෙළඹවිම වැනි සන්නිවේදන කාර්යයන් ඵලදායී ලෙස ඉටුකර ගැනිමට නිර්මාණාත්මක සන්නිවේදනය වැදගත්වේ.

අධ්‍යාපනය ලබා දෙන ගුරුවරුන් සිසුන්ට විෂය කරුණු කියාදිමේ දි උපමා රූපක චිත්‍ර රූප සටහන් යොදා ගැනිමෙන් සාර්ථකව ඉගැන්විය හැකිය. එමෙන්ම පුද්ගලයකු යම් අදහසකට මතයකට අවතනකර ගැනිම සදහා නිර්මාණාත්මක භාෂා භාවිතය වැදගත්වේ. රූපවාහිනිය නාට්‍ය ගිත නිර්මාණශිලිව ඉදිරිපත් කිරිම විනෝදය තීව්‍රර කරයි.

- ග්‍රාහකයා ආකර්ෂණය කර ගනිමින් ප්‍රබල ලෙස සන්දේශ ඉදිරිපත් කිරිමට නිර්මාණාත්මක සන්නිවේදනය වැදගත්වේ.

ජනමාධ්‍ය මගින් වැඩි ග්‍රාහක පිරිසක් ආකර්ෂණය කර ගැනිම සදහා විවිධ නිර්මාණාත්මක උපක්‍රම භාවිතා කරයි. පුවත්වල විශාල සිරස්තල යොදා ගැනිම නිර්මාණාත්මක වැකි යොදා ගැනිම ඡායාරූප යොදා ගැනිම දැක්විය හැකිය. ගුවන්විදුලියේ සුමියුරු නාදරටා සංගීත ඛණ්ඩ තාලය ආදිය යොදා ගනියි. රූපවාහිනියේ සජීවි චලන රූප දිප්තිමත් වර්ණ විවිධ කැමරා කෝණ යොදා ගනු ලබයි. එමෙන්ම දේශකයන් විද්වතුන් සිය දේශන ඉදිරිපත් කරිමේ දි මල්ටිමිඩියා ප්‍රක්ශේපණ යන්ත්‍ර වැනි තාක්ෂණික මාධ්‍ය යොදා ගනිමින් රූප සටහන් වගු ප්‍රස්ථාර කෙටි විඩියෝ පට ආදිය යොදා ගනියි. මෙතුලින් ආකර්ශනය වැඩි වශයෙන් සිදු කර ගත හැකිය.

නිර්මාණාත්මක සන්නිවේදනය පිළිබදව විශ්ලේෂණය කිරිමේ දි ජෙම්ස් වොට්සන්**(James Watson)** ගේ සන්නිවේදන අධ්‍යයනය යනු කුමක්ද? **(What is communication studies?)** නැමැති කෘතිය වැදගත්වේ. එම කෘතියෙහි සන්නිවේදනය හා නිර්මාණශිලිත්වය **(communication creativity)** නැමැති පරිච්ඡෙදය මෙහිදි වැදගත්වේ. එහි දක්වා ඇත්තේ නිර්මාණාත්මක සන්නිවේදනය මගින් කරුණු දහයක්

ඉටුකර ගත හැකි බවයි. ඒ සඳහා ඔහු දෙපසට දෑත් දිගු කරමින් සිටින මිනිස් රූපයක් යොදා ගත්තේය. දෑතේ ඇඟිලි දහයට කරුණු දහයක් ලබා දී තිබුණි.

<u>පහත කරුණු පහ එක් අතක ඇඟිලි පහ යටතේ දක්වා තිබුණි.</u>

- ගැටලු විසදා ගැනිමට හේතුවේ.
- පෙලඹවිමක් ඇති කරයි.
- උද්‍යාගිභාවයෙන් යුතු ක්‍රියාශිලිත්වයක් ඇති කරයි.
- අදහස් පණ ගැන්විමට උපකාරිවේ.
- පවතින දෙයක් කෙරෙහි අභියෝගයක් ඇති කිරිමට උපකාරි වේ.

<u>අනිත් අතේ ඇඟිලි පහ යටතේ පහත කරුණු දක්වා තිබුණි.</u>

- නිර්මාණශිලිත්වය යනු ගවේෂණාත්මක විමයි.
- කණ්ඩායම් කටයුතු වලට වැදගත්වේ.
- සෙසු අයගේ නිර්මාණශිලිත්වය ඇගයුමට උපකාරි වේ.
- නිර්මාණශිලිත්වය විවෘතය නම්‍යශිලිය.(පැති කිහිපයකට යොමු වේ).
- කාර්ය තෘප්තිය ඇති කරවයි.

## <u>7.2 නිර්මාණශිලිත්වයේ මූලිකාංග හඳුනා ගැනිම.</u>

නිර්මාණශිලිත්වයේ මූලිකාංග යන්නෙන් අදහස් වන්නේ නිර්මාණකරුවා සහ නිර්මාණ කාර්යය සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය වූ ගුණාංග හඳුනා ගැනිමයි. මෙහිදි නිර්මාණකරුවාට ස්වකීය නිර්මාණය සිදු කිරිම සඳහා උපකාරිවන අංග හඳුනා ගැනිමට උත්සහ කරයි. නිර්මාණශිලිත්වයේ අංග හඳුනා ගැනිමට නිර්මාණය/ නිර්මාණශිලිත්වය/ නිර්මාණාත්මක චින්තනය/නිර්මාණ ශිල්පියා/ සහ නිර්මාණාත්මක රචනය පිළිබඳව පැහැදලි කර ගැනිම වැදගත් වේ.

එමෙන්ම නිර්මාණශිලිත්වයේ මූලිකාංග කිහිපයක් පවති.

- නිර්මාණය/නිර්මාණශිලිත්වය.
- නිර්මාණාත්මක චින්තනය.
- නිර්මාණ ශිල්පියා.
- නිර්මාණාශිලි රචනය.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## නිර්මාණය.

නිර්මාණය යනුවෙන් අදහස් කරන්නේ "පෙර නොවූ විරූ" යන අදහසයි. එය නවෝත්පාදනය යනුවෙන්ද හැඳින්විය හැකිය. එමෙන්ම නිර්මාණය යනු තිබෙන හෝ පවතින යමකට වඩා වෙනස් වූ බිහිකිරිමකි. එනම් නැවුම් දෙයකි. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා නිර්මාණය හඳුන්වා දෙන්නේ මැවීම, සැදීම වශයෙනි.

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ නිර්මාණය විග්‍රහ කර ඇත්තේ " අලුත් යමක් නිපදවීමේ ක්‍රියාවලිය ලෙසයි".

අලුත් යමක් බිහිකිරිම සඳහා පුද්ගලයකු තුල සුවිශේෂී කලාත්මක හැකියාවක් හා කුසලතාවයක් තිබිය යුතුය. එමෙන්ම නව නිර්මාණයක් බිහිකිරිම සඳහා අවශ්‍ය වන වැදගත් සාධක අතර නිර්මාණකරුගේ කුසලතාව, ප්‍රතිභාව, පරිකල්පනය ව්‍යුත්පත්තිය, සතතභ්‍යාසය, බහුශ්‍රතතාව, දාර්ශනික සංල්පනා ආදී අරමුණු වැදගත්වේ.

විවිධ මාධ්‍ය විවිධාකාරයෙන් නිර්මාණය භාවිත කරයි. පුවත්පත්, ගුවන්විදුලිය, රූපවාහිනිය, වේදිකාව, සිනමාව තුළ නිර්මාණය විවිධ වේ. එමෙන්ම එක් එක් මාධ්‍යවල නිර්මාණය එයට ගැලපෙන ආකාරයෙන් භාවිතා කිරිම වැදගත් වේ. පුවත්පත් වල විශේශාංග, කතුවැකි, ශිර්ෂපාඨ නිදසුන්ය. ගුවන්විදුලියේ සංගිතය ගිතය නිදසුන්වේ. රූපවාහිනියේ වෙලිනාට්‍ය, දැන්වීම් නිදසුන්වේ. වේදිකාවේ නළු නිලයන්ගේ ඇඳුම්, පැලැඳුම් නිදසුන්වේ.

## නිර්මාණශිලිත්වය

නිර්මාණශිලිත්වය යනු නිර්මාණයක් බිහිකිරිමෙහිලා නිර්මාණකරුවෙකු සතු හැකියාවයි. නොවසේ නම් ශක්තියයි. එය පෙරදිග රසාස්වාදයේ දැක්වෙන්නේ ප්‍රතිභාව එනම් අන්තර්ඥානය/ප්‍රතිභාව ලෙසයි. මෙය පුද්ගලයකුට උපතින්ම ලැබෙන වාසනා ගුණයක් ලෙස පෙරදිග රසාස්වාදයේ දක්වා ඇත. නිර්මාණශිලිත්වය පුද්ගලයකුගේ අභ්‍යන්තරය ආලෝකවත්වීමේ ශක්තිය, පරිකල්පන හැකියාව, යමක් ගැඹුරින් දැකීමේ හැකියාව වැනි සාධක ගණනාවකින් මතුවන ගුණාංගයකි.

පෙර නොවූ විරූ අයුරින් ලෝකය සංජානනය කිරීමට ඇති හැකියාව, සැඟවුණු රටා දැකීම, බැලූ බැල්මට සබඳතාවයන් නොපෙනෙන ප්‍රපංච / සංසිද්ධි අතර සබඳතා ගොඩනැගීම සහ උත්පාදනය නිර්මාණශීලිත්වයේ මූලික ලක්ෂණ වේ.

ලියනාඩෝ ඩා විංචි ඉතාලි ජාතික චිත්‍ර ශිල්පියකු වූ අතර(**Leonardo Da vinci 1452 - 1519)** ඔහු සංගීතය, මූර්ති ශිල්පය, ගණිතය, ඉංජිනේරු විද්‍යාව, තාරකා විද්‍යාව, භූගෝල විද්‍යාව, උද්භිත විද්‍යාව වැනි විෂයන් දත් අයෙකි. ඔහු නිර්මාණශීලිත්වය පිළිබඳව කරුණු හතක් දක්වයි.

- කුතුහලය / දුර්ලභත්වය
- සුවිදර්ශනය / නිරූපනය
- සංවේදනය
- සාධුගමනය / මෘදුභාවය
- කලා විද්‍යා තුල්‍යතාව
- කායික මානසික තුල්‍යතාව
- සම්බන්ධතා

Udaya Amaraweera
BA University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
University Visiting Lecturer,
0711715342

චිත්‍ර කලාව පදනම් කොටගෙන ඔහු දක්වන අදහස් නූතන මාධ්‍ය කලාවට පොදුවේ.

ලෝකයේ සිදු කරන ලද විවිධ අධ්‍යයන ඔස්සේ නිර්මාණශීලි කාර්ය සිදු කිරීම සඳහා ඉවහල් වන මූලිකාංග කිහිපයක් දක්වා ඇත.

- සංවේදනය
- පරිකල්පනය
- ප්‍රත්‍යක්ෂණය
- සංජානනය
- අද්දැකීම් හා ප්‍රතිවින්දනය
- ප්‍රස්තුත ගවේෂණය.
- සතතාභ්‍යාසය
- කුසලතා හා භාවිතය.

Udaya Amaraweera
BA University of J'Pura, MA & M.Phil in
Mass.Com, University of Kelaniya.
University Visiting Lecturer,
0711715342

ඉහත කුසලතා මැනවින් හඳුනාගෙන පෝෂණය කර ගැනීම තුළින් භාෂා භාවිතය, කථිකත්වය, ලේඛනය ප්‍රාසංගිකත්වය සඳහා මැනවින් උපකාරී වේ.

නිර්මාණශීලිබව සහජයෙන් ලැබෙන බව පිළිගත් මතයකි. එහෙත් ඒවා මතු වී ඔපමට්ටම් වන්නේ පාරිසරික බලපෑම් හේතුවෙනි. නිර්මාණශීලී චින්තනය අළුත් ආකාරයකට ලෝකය දැකීමට පුද්ගලයන් මෙහෙයවයි. නිර්මාණශීලිත්වය තමා විසින් තමන්ටම ආවේනික ක්‍රමවේද ඔස්සේ දියුනු කර ගත යුතුය. නිර්මාණශීලී ලේඛනයේ දී අපට ගුරුකොට ගත හැක්කේ පෙර විසූ නිර්මාණකරුවන්ගේ අත්දැකීම්ය. කුමාරතුංග මුනිදාස මහතා නවක නිරුමාණකරුවන්ට දී ඇති උපදේශය නම් “ලියාපං, කියාපං, ඉරාපං” යන්නයි. එහිදී ඔහු විසින් අවධාරණය කර ඇත්තේ අඛණ්ඩ අභ්‍යාසය නිර්මාණාත්මක ලේඛනය දියුනු කර ගැනීමේ මාර්ගයක් බවයි.

## නිර්මාණාත්මක චින්තනය.

නිර්මාණාත්මක චින්තනය ලෙස හැදින්වෙන්නේ ලෝකය අපූර්ව ලෙස දැකීමටත් මානව සම්බන්ධතා හා පාරිසරික ක්‍රියාවලිය අපූර්ව ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට යොදා ගන්නා මානසික ශක්තියයි. පුද්ගලයකු සතු පරිකල්පන ශක්තිය නිර්මාණාත්මක චින්තනයේ උපරිම අවස්ථාවයි. නිර්මාණාත්මක චින්තනය පදනම් වන්නේ ලෝකය විවිධාකාරයෙන් නිරික්ෂණය කිරීමට ඇති හැකියාව මතයි. ඒ සඳහා මූලික වන්නේ ප්‍රතිභාව හා පරිකල්පනයයි.

නව නිර්මාණයක් බිහිවන්නේ පුද්ගලයකුගේ මනස තුළයි. මෙය ආත්ම ප්‍රකාශනයක් ලෙස හැදින්විය හැකිය. නිර්මාණකරුවෙකුට ස්වකීය නිර්මාණය ගොඩ නැගීම සඳහා ඉවහල් වන තේමාව නොවසේනම් වස්තු විෂය සඳහා ඔහු ලත් අත්දැකීම් ඉවහල් වේ. නිර්මාණ කරුවෙකුට ජීවන අත්දැකීම් ආකාර තුනකට ලැබේ.

- ස්වඅත්දැකීම් - *තමා විසින් අත්විදි දේ අත්දුටු දේ නිර්මාණයක් ලෙස ප්‍රතිනිර්මාණය කළ හැකිය. මෙහිදි නිර්මාණකරුවෙකු පෙර රැස් කරගත් අනුභූතින් ද වෙනත් මූලාශ්‍රයන්ගේ ආභාෂය ද තම නිර්මාණ කාර්යය සඳහා යොදා ගනියි. මනෝභාවයන්, විකාර රූපී අදහස්, මූලාශ්‍ර විය හැකිය.*

අන්‍යයන්ගෙන් ලබන අද්දැකීම් - *තමා ඇසුරු කරන සමාජයේ අයෙකු තමා වෙත පැවැසූ අදහසක්. වෙනත් පුද්ගලයකුගේ අද්දැකීමක් තමාට ලැබුණ ලිපියක සඳහන් කරුණක් දැක්විය යැකිය.*

- **මාධ්‍ය හෝ වෙනත් අද්දැකීම් -** *තමා පරිශීලනය කරන ලද නිර්මාණයක් වෙනත් නිර්මානයක් ගොඩ නැගීමට ඉවහල් වේ. ගීතයක් රස විඳින රසිකයකුට ඒ ගීතය ඇසුරින් තවත් නිර්මාණයක් කිරීමට හෝ නව කථාවක් කෙටි කථාවක් නිර්මාණය කිරීමට අනුභූතිය සපයා ගත හැකිය.*

**ඉහත ආකාරයෙන් උකහා ගන්නා ලද අද්දැකීම් නිර්මාණකරුවා මනාව පරිශීලනයේ යෙදෙමින් නිර්මාණ කාර්යය සඳහා යොදා ගනියි. මෙහිදි පරිකල්පනය පිළිබඳව පැහැදිළි කර ගත හැකිය. පරිකල්පනය යනු යමක් පිළිබඳව සිතින් මවා ගන්නා සංකල්ප, චිත්ත රූප ආදිය වේ.**

**නිර්මාණකරුවකුගේ පරිකල්පන ශක්තිය වර්ධනය කර ගැනිම සඳහා ප්‍රතිභාව සතතාභ්‍යාසය, ව්‍යුත්පත්තිය වැදගත් වේ.**

**නිර්මාණශිලි චින්තනය සඳහා නව අදහස් උත්පාදනය කිරිමේ චින්තන හැකියාව හා වෙනස්කම් හා නව අදහස් පිළිගැනිමට දක්වන ආකල්පිය හා දෘෂ්ටිය නම්‍යශිලිත්වය වැදගත් වේ. නිර්මාණශිලිත්වය යමෙකු තුළ වර්ධනය කර ගැනිම සඳහා පරාවර්තතාව, විවේදනාත්මකව විශ්ලේෂනාත්මකව සිතන ආකාරය වැදගත් වේ.**

**බ්‍රිතාන්‍ය සමාජ විද්‍යාඥ ග්‍රැහැම් වොල්ස් (Graham walls) The Art of Though -1926 කෘතියේ පුද්ගලයකු තුල ගොඩ නැගෙන නිර්මාණාත්මක චින්තනය අදියර හතරක් යටතේ විස්තර කරයි.**

- **සකස් කිරිම – ප්‍රස්තුතය සවිඥනනිකව හා කමාණුකුලව විමර්ශනය කෙරේ.**

- **පෝෂණය – ප්‍රස්තුතය පිළිබඳව සවිඥානිකව සිතිමෙන් වැලැකි සිතිමෙන් එය පෝෂණය වේ.**

- **ප්‍රදිපනය – නිර්මාණශිලි අදහස් ආශ්‍රිතව එසැනින් ඇතිවන ආවේශයෙන් නිර්මාණයට අදාල ප්‍රදිපනය බිහි වේ.**

- **සත්‍යාපනය – තම අදහස්හි වලංගු භාවය පරික්ෂා කර නිශ්චිත නිර්මාණාත්මක ආකෘතියකට ගනියි.**

පුද්ගලයා ප්‍රතිභාව මත නිර්මාණාත්මක චින්තනයේ ස්වභාවය වෙනස් විය හැකිය. යම් නිර්මාණයක් කිරිම සදහා කෙනෙකු තුළ පවතින ශක්තිය ප්‍රතිභාව ලෙස දැක්විය හැකිය. ප්‍රතිභා ශක්තිය හිමි වනනේ අපූර්ව වස්තු නිර්මාණය කිරිමේ හැකයාව ඇත්නම් පමණි. එය බොහෝ ඇසු පිරු සාධක හේතුවෙන් උත්පාදනය වන දෙයකි. මේ සදහා සියුම් ලෙස විනිවිද දැකිමේ පරිකල්පන ශක්තිය තිබිය යුතුය. මේ සියළු සාධක මූලික කරගනිමින් කෙනෙකුට අපූර්ව වස්තු නිර්මාණයට හැකියාව ලැබෙයි.

## නිර්මාණ ශිල්පියා

නිර්මාණශිල්පියා යනු කවරෙක්ද යන්න පිළිබඳව මෙහිදි විස්තර කිරිම වැදගත්වේ. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ නිර්මාණ ශිල්පියා පිළිබඳව විස්තර කරන්නේ යම් දෙයක් සැදූ හෝ නිපදවූ පුද්ගලයා වශයෙනි.

නිර්මාණ ශිල්පියකු හෝ නිර්මාණකරුවෙකු විම සුළු පටු කාර්යයක් නොවේ. මේ සදහා දිර්ඝ කාලින පුහුණුවක් අවශ්‍ය වේ. නිර්මාණ ශිල්පියකු විමට කලාව සමාජය, සංස්කෘතිය දේශපානය, පිළිබඳව ඇති අවබෝධය ද සමාජ මනෝ හා මානව විද්‍යා දිර්ඝ කාලිනව හැදැරිමෙන් ලබා ගන්නා අවබෝධයද අවශ්‍ය වේ. එයට අමතරව දැනුම, පරිකල්පනය, ප්‍රතිභාව සහ ශිල්පීය පරිචය මෙන්ම විශේෂ ප්‍රගුණතායක් ද අවශ්‍ය වේ.

## නිර්මාණශිලි රචනය.

ටෙලි නාට්‍යකට, ගුවන්විදුලියකට, වේදිකා නාට්‍යකට සිනමා පටයකට, ගිතයකට නිර්මාණාත්මක රචනය අත්‍යවශ්‍ය වේ.

නිර්මාණශිලි රචනය යනුවෙන් හදුන්වන්නේ යම් පුද්ගලයකු නිර්මාණශිලි මනසකින් කුමණ හෝ ශෛලියකින් ලියනු ලබන වෘත්තාන්තයක්, නව කථාවක්, කෙටිකථාවක් කවියක් හෝ වෙනත් නිර්මාණයකි.

මෙය නැවුම් භාෂා ශෛලියකින් රසිකයා තුළ චිත්තාකර්ෂණිය භාවයක් ඇතිවන ආකාරයෙන් ලිවිම වැදගත්වේ.

නිර්මාණශිලි රචනයේ මූලික අරමුණවන්නේ රසිකයාට සිතිවිලි හැගිම් සහ රසභාව පූර්ණ චිත්ත තත්ත්වයක් ඇති කිරිමයි.

මෙහිදි නිර්මාණශිලි රචනය පිළිබඳව විස්තර කිරිම වැදගත් වේ. නිර්මාණශිලි රචනා ලෙස කවිය, ගිතය, නව කථාව, කෙටි කථාව, චරිතාපදාන, සාහිත්‍ය දැක්විය හැකිය.

එමෙන්ම නිර්මාණශිලි රචනය සඳහා යොදා ගනු ලබන භාෂාව සුවිශේෂි වේ. රසිකයාගේ පරිකල්පනය පුබුදු කරවන්නක් විය යුතුය. ව්‍යංගාර්ථ පූර්ණ විය යුතුය. රසිකයා සනසාලන්නක් විය යුතුය. සිනහව, ප්‍රහර්ෂය සන්තාපය ඉස්මතු කරයි.

විශිෂ්ට නිර්මාණශිලි රචකයකුගේ නිර්මාණශිලි රචනා තුළ මතුපිට අර්ථයට යටින් දිවෙන අර්ථ ගැබ්වි ඇත. ඒ ගැඹුරු අර්ථ රසිකයාගේ භාව පෝෂණයට, ජිවන පරිඥානයට හේතුවේ.

නිර්මාණාත්මක රචනයේ දි නිර්මාණාත්මක භාෂාව භාවිත කිරිම වැදගත් වේ. කවි, නවකථා, පුවත්පත් වල එකිනෙකට වෙනස් භාෂාරටාවන් යොදා ගනියි. විශේෂයෙන්ම සිනමා, ටෙලිනාට්‍ය ගුවන්විදුලි පිටපත් රචනයේ දි සරල බස් වහරක් හෝ කටවහර යොදා ගනු ලැබේ. වෙළඳ දැන්වීම් නිර්මාණයේ දි පුනරුච්චාරණයයොදා ගැනේ. වේදිකා නාට්‍ය, සිනමා, ටෙලිනාට්‍ය වල සංවාද බහුල වශයෙන් යොදා ගැනේ.

## 7.3 සන්නිවේදනය සඳහා නිර්මාණශීලීව භෂාව භාවිත කිරීම.

### හැදින්වීම

මානව ශිෂ්ටාචාරයේ සුවිශේෂී සන්ධිස්ථානයක් වශයෙන් මානවයා භාෂාව නිර්මාණය කර ගැනීම දැක්විය හැකිය. භාෂාව නිපදවා ගැනීමත් සමගම මානව සන්නිවේදනය වේගයෙන් සංවර්ධනය විය.

විද්වතුන්ගේ අදහසට අනුව දැනට කථා කරනු ලබන මානව භාෂාවන්ගෙන් බිහිවීම මීට වසර 60000 – 100000 දක්වා ඈතට දිවයයි. එමෙන්ම සියළුම භාෂාවන් එක් මූලයකින් බිහිවී ක්‍රමයෙන් විකාශය වූ බව තවත් මතයකි. මානව භාෂාවේ පැරැණිම සොයා ගැනීමක් වශයෙන් දකුණු අප්‍රිකාවේ බිලොම්බොස් ගල්ගුහා ආශ්‍රිතව මෙයට වසර 750000 – 80000 කාලයට අයත් සමර පැහැයට හුරු කතිර හැඩයේ සංකේත දැක්විය හැකිය.

භාෂාව යනු සංකිර්ණ සන්නිවේදන පද්ධති උපාර්ජනය කර ගැනීමට සහ භාවිතා කිරීමට ඇති හැකියාවයි. එමෙන්ම මෙය තවත් ආකාරයකින් පැහැදිලි කලහොත් භාෂාව යනු අර්ථ සන්නිවේදනය කිරීම සඳහා එකිනෙකට සුසම්බන්ධිත ව්‍යාකරණ නීත -රීති වලින් ක්‍රියාත්මක වන විධිමත් සංඥා පද්ධතියකි.

භාෂාව වචන නොව ශබ්දවලින් ජනනය වේ. භාෂාව හේතුවෙන් මිනිසාට සංවිධානවීමේ හැකියාව, තර්කාණුකූලව යමක් වටහා ගැනීමේ හැකියාව, භාෂා මාධ්‍යයෙන් යමක් වටහා ගැනීමේ හැකියාව සහ අවශ්‍යවිටක එය සිහි කැදවා තීන්දු තීරණ ගැනීමේ හැකියාව, ලිඛිත භාෂාව ඔස්සේ දැනුම ගබඩා කිරීමේ සහ අපූර්වයෙන් නිෂ්පාදිත දැනුම කියවා තිරණ ගැනීමේ හැකියාව ඇතිවිය.

භාෂාව යන්න ඇතැම් විට කේත, සංඛ්‍යාත, මෙන්ම පරිගණක ආශ්‍රිත වැඩසටහන්(මුද්‍රකාංග) යන ආදී කෘතිමව නිපදවන ලද සන්නිවේදන පද්ධති හැදින්වීම සඳහා ද භාවිතා කෙරේ.

මානව භාෂාව විද්‍යාත්මකව හැදෑරීම වාග්විද්‍යාව මගින් සිදුවේ. එමගින් භාෂාවේ ව්‍යුහය, අන්තර්ගතය, ව්‍යාකර,ණය භාෂාවක් ගොඩනැගෙන ආකාරය භාෂාව හා සමාජය සංස්කෘතික ප්‍රවණතා, භාෂාවේ දාර්ශනික හා මනෝ විද්‍යාත්මක පැතිකඩ අධ්‍යයනය කෙරේ.

භාෂාවක් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම් ජීව භාෂා සහ මල භාෂා යනුවෙනි. දැනට පද්ගලයන් කථා කරනු ලබන ලිඛිත කාර්යයන් සඳහා යොදා ගන්නා භාෂාවන් ජීව භාෂාවන් යනුවෙන් හඳුන්වයි. භාෂාවක් වදවීම භාවිතයෙන්, තොරවීම මල භාෂා යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජීව භාෂාවන් පිළිබඳව විමසීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය හෝ වෙනත් මාධ්‍යය දක්වා විහිදී යයි. එමෙන්ම ග්‍රැෆික්, ලේඛන, බ්‍රේල් විසිල් ගැසීම දක්වා විකාශය වී ඇත. මේවන විට ලෝකයේ ජීව භාෂා 6000 – 7000 ක් අතර ප්‍රමාණයක් හඳුනා ගෙන තිබේ.

භාෂාව මානව සමාජය යම් සන්ධිස්ථානයකට ගෙන එනු ලැබීය. විශේෂයෙන්ම ජන කණ්ඩායම් ගොඩ නගනු ලැබීය. එම ජන කණ්ඩායම් වලට අදාළ සුවිශේෂී සංස්කෘතීන් බිහි කළේය. එපමණක් නොව විවිධ වූ සිරිත් විරිත් චාරිත්‍ර වාරිත්‍ර නීති රීති පද්ධති බිහි කොට එම උප සංස්කෘති වලට අනන්‍ය වූ රටවල් ද බිහි කළේය. මෙම සංස්කෘතිකාංග පරපුරෙන් පරපුරට රැගෙන යාමද භාෂාව මගින් සිදුවේ.

එමෙන්ම භාෂාව භාවිතා කරනු ලබන සංස්කෘතික පරිසරය අනුව එකම භාෂාව තුළ පවා වෙනස්කම් පවතී. උදා: ශ්‍රී ලංකාවේ පහත රට උඩරට, පුද්ගලයන් භාවිතා කරන සිංහල භාෂාවේ වෙනස්කම් ඇත.

යම් භාෂාවක් වහරන ආකාරය අනුව පුද්ගලයන්ගේ ජාතිය, සංස්කෘතිය, ආගම යන ආදී ලක්ෂණ හඳුනාගත හැකිය. නිදසුනක් ලෙස යමෙක් යම් භාෂාවක් උච්චාරණය කරන ශබ්දය අනුව වාර්ගික සුළුතරභාවය, සමාජ පන්තිය, උපන් ප්‍රදේශය ආදිය අනාවරණය

කර ගත හැකිවේ. එමෙන්ම සංස්කෘතික සමාජ පරතරය දැක්වීම සඳහා ද ඇතැම් භාෂාවන් තුළ වාග් විද්‍යාත්මක ක්‍රම පවතී. ඉංග්‍රීසි භාෂාවේ **Mr,Mrs,boy,Doctor,Your,Honour** ආදී සුවිශේෂී වදන් දැක්විය හැකිය. සිංහල භාෂාවේද පූජ්‍ය, උතුමාණෙනි, මහත්මයාණෙනි, ආචාර්ය, මහාචාර්ය, වැනි වදන් දක්විය හැකිය.

භාෂාව නිර්මාණශීලීව කථනය සඳහා ලේඛනය සඳහා යොදා ගැනීමෙන් එක් එක් ලේඛකයාට මාධ්‍ය වලට අනන්‍ය වූ රීතීන් බිහිවිය. මාටින්වික්‍රමසිංහ, සයිමන් නවබද්දේගම, කුමාරතුංග මුණිදාස වැනි සාහිත්‍ය ශූරීන්ගේ ලේඛන වල බස ඔවුන්ටම අනන්‍යවූ නිර්මාණශීලීත්වය මත පදනම් වී ඇත. මේ සඳහා ඔවුන් තුළ පැවැති පරිකල්පන ශක්තිය ඉවහල් විය.

නිර්මාණශීලි ලේඛන කලාව පාඨකයා, රසිකයා ආකර්ශනය කරන්නෙකි. අතීත සහ අද්‍යයතන නිර්මාණශීලී රචකයන්ගේ භාෂා භාවිතය හේතුවෙන් සමාජයේ පාඨක සමාජ බිහිවිය. ඔවුන්ගේ අනුගාමිකයන් ඔවුන් අනුකරණය කිරීම නිසා ලේඛන පරපුරක් බිහිවිය. එමෙන්ම නව කථාව, කෙටි කථාව, කවි වැනි නිර්මාණ මෙන්ම දර්ශනය, දේශපාලනය ආගමික අදහස් ප්‍රචලිතවීම වේගයෙන් සිදුවන්නේ නිර්මාණශීලී භාෂා භාවිතය නිසාය.

නිර්මාණාත්මක සන්නිවේදනයේ දී ප්‍රකාශය විධි වැදගත් වේ. මානයා මතු ප්‍රබලතම නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රමවේදය භාෂාව වේ. ලිඛිත, අලිඛිත, වාචික, නිර්වාචික ආදී කවර ක්‍රමවේදයක් භාවිතා කිරීමෙන් වුවද නිර්මාණශීලීත්වයෙන් යුක්තව සන්නිවේදනයේ යෙදිය හැකිය.

ලෝකයේ පවතින කවර භාෂාවක් ගත්තද එහි නිර්මාණාත්මක වහරක් අන්තර්ගත වේ. එමෙන්ම විවිධ රටවල පවතින විවිධ භාෂාවන් එකී සමාජ වල සමාජ සංස්කෘතික හැඩය සකස් කිරීමෙහි ලා මූලික විය.

නිර්මාණාත්මක භාෂාව කථා කිරීම (කථනය) සවන්දීම(ශ්‍රවණය) ලිවීම(ලේඛනය) කියවීම පදනම් කරගෙන ගොඩ නැගී ඇත.

වර්තමානයේ භාවිතා වන ජනමාධ්‍ය කවර ආකාරයකින් නිර්මාණශීලීත්වය යෙදා ගෙන තිබේද යන්න පිළිබඳව මෙහිදී විමසීම වැදගත් වේ. ගුවන්විදුලි බස ශබ්දය සහ ශ්‍රවණය පදනම් කොටගෙන ගොඩනැගී ඇත. ගුවන්විදුලියේ නිර්මාණාත්මක භාෂාව අවබෝධ කර ගැනීම සඳහා ශ්‍රවණ ඉන්ද්‍රිය සහ මනස අතර සබදතාවය අවබෝධ කර ගැනීම වැදගත් වේ.

මුද්‍රිත මාධ්‍යයේ දී ලිඛිත භාෂාව ප්‍රමුඛ වේ. එයට අමතරව මෙහිදී දෘශ්‍ය රූපද භාවිතා කරයි. රූපවාහිනියේ නිර්මාණශීලි භාෂාව පිළිබඳව විමසීම වැදගත් වේ. රූපවාහිනයේ මාධ්‍ය බස

ශබ්ද මාධ්‍ය භාෂාවේ හා ශ්‍රව්‍ය මාධ්‍ය භාෂාවේ දිගුවක් ලෙස හැදින්වේ. නාට්‍ය කලාවේ දී යථාර්ථවාදී ප්‍රවේෂයද දැන්වීම් කලාවේදී මනෝ වාද්‍යාත්මක ප්‍රවේෂයද වැදගත්වේ.

සිනමාව පිළිබදව විමසීමේ දී සිනමාවේ භාෂාව රූපය වන අතර එහි ව්‍යාකරණය ලෙස සැලැකෙන්නේ සංස්කරණයයි.

නව මාධ්‍ය වල අතිශ්‍ය සියුම් ආකාරයෙන් නිර්මාණශීලී භාෂාව භාවිතා වේ.

නිර්මාණශීලී භාෂාවේ මුලික කාර්යය වන්නේ භාෂාව පදනම් කරගෙන ලිඛිතව, වාචිකව, නිර්වාචිකව සන්නිවේදනය කිරීමයි.

ලිඛිත සන්නිවේදනයේ ප්‍රධානතම නිර්මාණශීලී මෙවලම වන්නේ පුවත්පතයි. එහි අන්තර්ගතය විමසීමේ දී පෙනී යන්නේ වර්ණවත් වෙළද දැන්වීම්, විවිධ රූප සංකේත, කාටූන් වර්ග, තීරු රචනා, සම්මුඛ සාකච්ඡා දැක්විය හැකිය. පුවත්පතේ නිර්මාණශීලිත්වය වර්ධනය වීම සදහා මුද්‍රණ තාක්ෂණයේ ඇතිවූ වර්ධනය ඉවහල් විය. විශේෂයෙන්ම ඕෆ් සෙට් මුද්‍රණ තාක්ෂණය, පරිගණක මුද්‍රාකාංග බිහිවීම දැක්විය හැකිය.

ගුවන්විදුලියේ නිර්මාණශීලිත්වය පිළිබිඹු කරන අංග ලෙස ආකර්ශනීය වදන් භාවිතය, සංගීතය, නිහඬතාවය දැක්විය හැකිය.

## පුවත්පත හා නිර්මාණශීලිත්වය.

පුවත්පතේ පවතින නිර්මාණාත්මක භාෂා භාවිතය පිළිබදව විමසීමේ දී එය කොටස් දෙකක් යටතේ සාකච්ඡා කළ හැකිය.

- පෙළ
- රූප

පෙළ යනුවෙන් අදහස් කරන්නේ ලිඛිත භාෂා ව්‍යවහාරයයි. ඒ යටතට ප්‍රවෘත්ති, විශේෂාංග, දැන්වීම්, තීරුලිපි, කතුවැකි ආදිය දැක්විය හැකිය. ඉහත දක්වන ලද විවිධ අංග සදහා භාවිතා කරන භාෂා ශෛලියේ විවිධ වෙනස්කම් පවතී.

පුවත්පතක රූප යන්නෙන් අදහස් කරන්නේ ඡායාරූප, චිත්‍ර, සිතියම් අක්ෂර (Graphic) කාටූන්, විවිධ අලංකාර ක්‍රම වර්ණ භාවිතය හා පිටු සැකසුමයි. මෙම අංග පුවත්පතේ පළ කිරීමේ දී විවිධ නිර්මාණාත්මක ක්‍රමවේද භාවිතා කරයි. විශේෂයෙන්ම වර්තමානයේ මුද්‍රණ තාක්ෂණයේ වර්ධනයත් සමග නව තාක්ෂණය මුසුවීමෙන් ඉතාමත්ම ආකර්ෂණීය නිර්මාණ පුවත්පත වල පළවේ.

## i. ප්‍රවෘත්ති

පුවත්පතක ප්‍රධානතම ලක්ෂණයක් වශයෙන් ප්‍රවෘත්ති දැක්විය හැකිය. එමෙන්ම පුවත්පතක ජීවනාලිය වන්නේ ද ප්‍රවෘත්ති වේ. පුවත්පතක පැවැත්ම රදා පවතින්නේ එහි පළ වන ප්‍රවෘත්ති මතයි.

පුවත්පතක ප්‍රවෘත්ති පළ කිරීම යම් නිශ්චිත ආකාරයකට අනුව සිදුවීම වැදගත් වේ. පුවත්පතේ ප්‍රවෘත්තියක්  පළ කිරීමේ දී කාලීනබව, සංශිප්තබව, විශ්වසනීයබව, නිරවද්‍යභාව,ය පැහැදිලිකම සුරැකෙන ආකාරයෙන් පළ කිරීම වැදගත්වේ. ඉහත දක්වන ලද කරුණු වලට අනුගතව නිර්මාණාත්මක ශෛලියක් පුවත්පත් ප්‍රවෘත්ති රචනයේ දී යොදා ගැනීම වදගත්වේ.

පුවත්පතක පළවන ප්‍රවෘත්තියක වැදගත් නිර්මාණශීලි ලක්ෂණයක් ලෙස සරල සහ ඍජු වැකි භාවිතා කිරීම දැක්විය හැකිය. විශේෂයෙන්ම  ප්‍රවෘත්ති ශිර්ෂපාඨ රචනයේ දී සරල ආකර්ශණීය වැකි භාවිතා කරයි.

උදා: රිය අනතුරකින් දෙකක් බේරේ තුනක් බේරේ.

රිය අනතුරකින් දෙනෙක් දිවි බේරී ඇති බව සහ තිදෙනෙක් බේරේ වැටට වැටී ඇති බව මෙයින් කියවේ.

උදා: නියෝජ්‍ය ඇමැති මණ්ඩලය හතලිහට නගී.
උදා : සෑම නිවසකටම විදුලිය

නමුත් අවස්ථානුකූලව පුවත්පතේ ප්‍රවෘත්ති රචනය වෙනස් විය හැකිය. යම් සුවිශේෂී පුද්ගලයක්ගේ අවමගුල් උත්සවයක දී හෝ රාජ්‍ය නායකයකුගේ විශේෂ කටයුත්තක දී දීර්ඝ ශීර්ෂ පාඨ යොදා ගැනේ.

උදා:

අභිනවයෙන් පත්වූ ජනාධිපතිතුමා ශ්‍රී දළදා මාලිගාව වැද පුදා ගනීමෙන් පසුව වැඩ භාර ගනියි.

## ii. විශේෂාංග

පුවත්පතේ විශේෂාංග යටතට විශේෂාංග ලිපි, තීරු ලිපි, කතුවැකි, කෙටි කතා, චිත්‍ර කතා, විචාර, සංවාද, පාඨක අදහස්, ඡායාරූප, චිත්‍රපට වාර්තා යන ආදී ප්‍රවෘත්ති හා දැන්වීම් නොවන සියලු කොටස් ඇතුලත් වේ.

- **කතුවැකිය**

පුවත්පතක මතවාදය ඉදිරිපත් කරන්නේ කතුවැකියෙනි. කතුවැකිය සංස්කාරක වැකිය, සංස්ලේඛය ලෙසද හැඳින්වේ. කතු වැකිය යනු එම දවසේ හෝ සති අන්තයේ කාලීන වශයෙන් වැදගත් වන රටේ ජාතික සංස්කෘතික දේශපාලන, සෞඛ්‍ය, අධ්‍යාපන යන ආදී ඕනෑම ක්ෂේත්‍රයක සිදුවීම් අළලා පුවත්පත් ආයතනය ඒ පිළිබඳව අවශ්‍ය ජනමතය සකස් කිරීමෙහිලා ඉදිරිපත් කරන මතවාදය අන්තර්ගත පුවත්පත් මණ්ඩලයේ ප්‍රකාශනයයි. කතුවැකියේ භාෂාව බොහෝ විට විවේචනාත්මක ශෛලියක් ගනියි. උපදේශනාත්මක ආකාරයෙන් ද යුක්ත විය හැකිය. කෙටි වැකි මෙන්ම දීර්ඝ වැකිද යොදා ගනු ලැබේ. යම් යම් පුද්ගලයන්ට ආයතන වලට බලපෑම් සහගත වන අයුරින් භාෂාව යොදා ගැනේ.

උදා: පාරට කුණු දැමීමේ වැඩ නැවැත්විය යුතුය.

- **තීරු ලිපි**

පුවත්පතේ දීර්ඝ ලිපි සපයා ඉතිරිවන කුඩා ඉඩකට සම්පූර්ණ කිරීම සඳහා මුල් කාලයේ තීරු ලිපි ලියවිනි. විටක හාස්‍ය ජනක ලෙසත් උපහාසාත්මක ලෙසත් විවේචනාත්මක ලෙසත් කෙටි යෙදුම්, උපහැරණ, කාව්‍යමය රිද්ම රටා ඇසුරු කර ගනිමින් තීරු ලිපි ලියවේ. ඇතැම් විට සරල බස් වහරක් මෙන්ම වියත් වහරට යොදා ගැනේ. මෙහිදී රචකයාගේ භාෂා අනන්‍යතාවයට මෙන්ම ආකර්ශණීය භාවයට වැඩි ඉඩක් හිමිවේ. ප්‍රසිද්ධ පුවත්වල පළවූ ජනප්‍රිය තීරු ලිපි වශයෙන් මනිගේ තීරුව මඩිස්සලේ, කිබොනට්, පනාපුත්‍ර දැක්විය හැකිය. එමෙන්ම අවශ්‍යතාවය අනුව තීරුලිපි දේශපාලනමය තීරුලිපි, කවි තීරුලිපි කතන්තරමය තීරුලිපි, හාස්‍යජනක තීරු ලිපි, වෛද්‍යමය තීරුලිපි, ආර්ථික විද්‍යා තීරු ලිපි ලෙස වර්ග කළ හැකිය.

- **<u>විශේෂාංග ලිපි</u>**

**පුවත්පතක විශේෂාංග ලිපි ලෙස හඳුන්වන්නේ යම් විෂය ක්ෂේත්‍රයකට අදාලව යම් කරුණක් හෝ සිද්ධියක් පිළිබඳව සවිස්තරාත්මකව සිදු කරන රචනාවන්ය.**

**විශේෂාංග සාමාන්‍යයෙන් රචනාමය භාෂා ශෛලියකින් පිටු භාගයක් පිටුවක් හෝ පිටු දෙකක් පුරා රචනා වෙයි. පුවත්පතක පළ වන විශේෂාංග ලිපි වර්ග කිහිපයක් හඳුනා ගත හැකිය.**

- **පරිසර විද්‍යාත්මක විශේෂාංග ලිපි**
- **අපරාධ විශේෂාංග ලිපි**
- **සංස්කෘතික විශේෂාංග ලිපි**
- **දේශපාලන විශේෂාංග ලිපි**
- **ගවේෂණාත්මක විශේෂාංග ලිපි**

**බොහෝ විට විශේෂාංග ලිපි රචනා කිරීමේ දී සරල බස් වහරක් භාවිතා කරයි. එමෙන්ම රචනා කරන විශේෂාංගයට ලිපියට අදාලව ඡායාරූප පළ කිරීම ද සිදු කරයි. විශේෂාංග ලිපි රචනා කිරීමේ දී ආකර්ශනීය ලිඛිත සන්නිවේදන ක්‍රම භාවිතා කරයි.**

**උදා: සිත් මල් තලාලයි පාරට දමන්නේ.**

## iii. <u>පුවත්පත් දැන්වීම්</u>

**පුවත්පතේ පැවැත්ම සඳහා දැන්වීම් වැදගත් වේ. පුවත්පතක දැන්වීමක් පළ කිරීම සඳහා සැලැකිය යුතු වියදමක් දැරීමට සිදු වේ. එබැවින් දැන්වීම්කරුවන් විශාල පාඨකයන් පිරිසක් ආකර්ශණය කර ගැනීම සඳහා චිත්තාකර්ශණීය වදන්, විසිතුරු වර්ණයන් භාවිත කරයි. පුවත්පතක පළ වන දැන්වීම් ප්‍රධාන කොටස් තුනක් යටතේ වර්ග කළ හැකිය.**

- **ප්‍රධාන දැන්වීම්**
- **ලුහුඬු දැන්වීම්**
- **උපදේශනාත්මක දැන්වීම්**

පුවත්පතේ පළ වෙන ප්‍රධාන දැන්වීම් වැඩි ඉඩකඩක පළ වේ. බොහෝ විට තීරුවක් පිටු කාලක් භාගයක් හෝ ඇතම් විට පිටුවක් ද විය හැකිය. ලුහුඩු දැන්වීම් සීමිත ඉඩකඩක පළ වේ. ආකරිශණීය භාෂා ශෛලියක් යොදා ගැනේ.

දැන්වීම් වලින් මූලිකව සිදු කරන්නේ පුද්ගලයන්ගේ භාවයන්ට ආමන්ත්‍රණය කිරීමයි. ආදරය කරුණාව, බිය, ශෘංගාරය, කුතුහලය යන භාවයන් උද්දීපනය කොට භාණ්ඩ මිලදී ගැනීමට පොළඹවා ගැනීම මෙමගින් සිදු කරයි. පුවත්පත් මාධ්‍යයේ පල වන දැන්වීම් පිළිබඳව විමසීමේ දී දෘශ්‍ය ප්‍රයෝගයන් බොහෝ විට භාවිතා කරයි. ග්‍රැෆික් අක්ෂර රටාවන් කෙටිවැකි, විවිධ අකුරු හැඩතල, දීප්තිමත් වර්ණ ආදිය දැන්වීම් වල ඇති නිර්මාණශීලී අංග වේ.

## පොත් / ග්‍රන්ථ

මුද්‍රිත ප්‍රකාශන අතර අතිශ්‍ය වැදගත් නිර්මාණශීලී මාධ්‍යයක් වශයෙන් පොත් /ග්‍රන්ථ හඳුන්වා දීමට හැකිය. විවිධ විෂයන් අරභයා පොත් /ග්‍රන්ථ රචනා වේ. ආගමික ග්‍රන්ථ, සාහත්‍ය ග්‍රන්ථ, පර්යේෂණාත්මක ග්‍රන්ථ, කවි පොත්, කෙටිකතාව, චරිතාපදාන, දේශාටන සටහන්, පරිවර්තන කෘති මෙහිදී වැදගත් වේ.

පොත් /ග්‍රන්ථ වල ස්වරූපය අනුව යොදා ගන්නා ලේඛන ව්‍යවහාරය වෙනස් වේ. ජාතක කථා පොත, සද්ධර්ම රත්නාවලිය, අමාවතුර, බුත්සරණ, පූජාවලිය වැනි ආගමික ග්‍රන්ථ වල ලේඛන ව්‍යවහාරය පරික්ෂා කරන විට පෙනී යන්නේ පාඨකයා තුළ බුද්ධාලම්භන ප්‍රීතිය ,ආගමික භක්තිය ඉස්මතු වන ආකාරයෙන් දීර්ඝ විස්තර, උපමා උපමේය යොදා ගනිමින් රචනා කොට ඇති බවයි. විශේෂයෙන්ම පැරැණි ආගමික ග්‍රන්ථ ශ්‍රව්‍ය රසයට මුල් තැන දෙමින් රචනා වී ඇත. ඊට උචිත ලේඛණ ව්‍යවහාරයක් ද භාවිතා කොට ඇත. දීර්ඝ වර්ණනා ආදිය භාවිතා කොට ඇත.

විවිධ විෂයන් අරභයා පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියවේ. නව දැනුම ලොවට හඳුන්වා දීමට නව සොයා ගැනීමක් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට ග්‍රන්ථ ලියවේ. මේවායේ බස් වහර කෙටිය, ගැඹුරුය. එක් එක් විෂයට උචිත පාරිභාෂික පද මාලාවන් භාවිතා කරයි.

වර්තමානයේ බහුල වශයෙන් ජනප්‍රිය ලේඛන මාධ්‍යයක් වශයෙන් නවකථා, කෙටිකථා, කවි, නිසදැස් දැක්විය හැකිය. බොහෝ විට මේවා සරල බස් වහරකින් ලියවේ. කථා ව්‍යහභාරයට ඇතැම් විට භාවිතා වේ. සංවාදමය භාෂා රටාවන්, දෙබස් මේවායේ අන්තර්ගත වේ. ඇතැම් විට මෙම ග්‍රන්ථ වල මතුපිට කවරය ඉතාමත්ම ආකර්ෂණීය ලෙස

මුද්‍රණය කොට තිබේ. මේවා කියවන පාඨකයන් තුළ පරිකල්පනය ඇති වන අයුරින් නිර්මාණාත්මක භාෂා ශෛලියකින් රචනා කොට ඇත.

පුවත්පත් මාධ්‍යයේ දී මෙන් නොව සාහිත්‍ය ග්‍රන්ථ නිර්මාණකරණයේ දි භාෂාවේ නිර්මාණශිලිත්වය සහ එයින් මතු වන රස භාව හා පරිකල්පන ශක්තිය විශේෂ වේ. නිර්මාණ ශිල්පියාගෙන් නිර්මාණ ශිල්පියාට පොතක පරිශිලන භාෂා භාවිතය වෙනස් වේ.

දක්ෂ සන්නිවේදකයකුට දේශිය හෝ විදේශිය වශයෙන් පවතින පුරාතන සහ නවින සාහිත්‍ය නිර්මාණ ශාස්ත්‍රිය ග්‍රන්ථ, පරිවර්තන අධ්‍යයනය කිරිමෙන් තම නිර්මාණාත්මක හැකියා වර්ධනය කර ගත හැකිය.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## සඟරා

සඟරා වල ලිඛිත සහ දෘශ්‍ය නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රම අන්තර්ගත වේ. විවිධ විෂයන්, තේමාවන් අරභයා සඟරා මුද්‍රණය කරයි. සගරා දෙමසකට වරක්, මසකට වරක්, ත්‍රෛයිමාසිකව, සතිපතා ආදී වශයෙන් පළ වේ. බොහෝ විට විවිධ හැඩතල, වර්ණවත් ඡායා රූප ආදිය අන්තර්ගත වේ. යම් විශේෂ විස්තරයක් ඉදිරිපත් කිරීමේ දී එයට ගැලැපෙන ඡායා රූප ඇතුලත් කරයි. සඟරාවල මතුපිට කවරය ඉතාමත්ම ආකර්ෂණීය ලෙස මුද්‍රණය කරයි. සඟරා මුද්‍රණය කිරීම සඳහා පරිගණක තාක්ෂණය, ඩිජිටල් ශිල්පක්‍රම භාවිතා කරයි. සඟරාවල වර්ණ සංකලණය ඉතාමත්ම ඉහල මට්ටමේ පවතී. විවිධ විෂයන් අරඹයා මෙන්ම විවිධ පාඨක කණ්ඩායම් ඉලක්ක කොට ගෙනද සගරා ප්‍රකාශයට පත් කරයි.

## ගුවන්විදුලියේ නිර්මාණශීලිත්වය.

ගුවන්විදුලිය හඬ ආත්මය කොට ගත් ප්‍රබල සන්නිවේදන මාධ්‍යයකි. ගුවන්විදුලියේ භාෂාව මිනිස් හඬ, සංගීතය, ස්වභාවික ශබ්ද ප්‍රයෝග හා නිහඬතාවය සංකලනයවීමෙන් සකස් වූ මාධ්‍යයකි.

ගුවන්විදුලියේ විකාශය වන වැඩසටහන් අතර ප්‍රවෘත්ති, ගීත, දැන්වීම් ගුවන්විදුලි නාට්‍ය, වාර්තාමය සගරාමය වැඩසටහන් වැදගත් වේ. ගුවන්විදුලි මාධ්‍යෙය් වැදගත්ම පුද්ගලයා

වන්නේ ග්‍රාහකස්ථානයේ සිටින පුද්ගලයායි. හඬ නිර්මාණාත්මක ලෙස භාවිතා කරන්නේත්, වැඩසටහන් ආකෘතික වශයෙන් හා නව්‍ය ආකාරයෙන් සම්පාදනය කරන්නේත් ග්‍රාහකස්ථානයේ සිටින ශ්‍රාවකයා ඉලක්ක කර ගනිමිනි.

ගුවන්විදුලි භාෂාවේ භාවිතා වන හඬ ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකිය.

- වචන
- හඬ සහ හඬෙහි ප්‍රභේද
- සංගීතය    නිහඬතාව

## වචන

ගුවන්විදුලියේ දි බස හැසිරවීමේ දී වචන සහ ස්වර පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරිම වැදගත් වේ. යම් භාෂාවක වචන භාවිතා කිරිමේ දී එහි උච්චරණ ස්වරූපය අනුව ශ්‍රාවකයා තුළ පරිකල්පනය විවිධ අයුරින් ජනිත වේ.

## ශබ්ද(හඬ) ප්‍රභේද

ගුවන්විදුලි භාෂාවේ නිර්මාණාත්මක ලක්ෂණයක් වශයෙන් හඬ භාවිතා කිරිම දැක්විය හැකිය. විශේෂයෙන්ම නාට්‍ය සංගිත වැඩසටහන් වෙළඳදැන්වීම් ප්‍රවෘත්ති වලදි විවිධ අයුරින් හඬ භාවිතා වේ. නිර්මාණශීලී ලෙස පහත සඳහන් අයුරින් හඬ භාවිතා වේ.

- මිනිස් හඬ
- සවභාවික ශබ්ද ( දිය දහරාවක් ගලා යාම, කුරුල්ලන්ගේ නාදය, මුහුදු රළ නැගීම).
- කෘතිම ශබ්ද ( මෝටර් රථ වල ශබ්ද, දුම්රිය වල ශබ්ද, ගුවන්යානා වල ශබ්ද)
- සංඥාමය ශබ්ද ( යම් සංගීත කණ්ඩයක් මගින් අභිමානය උපහාසය වැනි අදහස් ජනිත කිරීම).

ගුවන්විදුලියෙන් විකාශය වන වැඩසටහන් විවිධ අයුරින් වර්ග කළ හැකිය. ආගමික වැඩසටහන්, අධ්‍යාපනික වැඩසටහන්, සංවර්ධන වැඩසටහන්, වෛද්‍යමය වැඩසටහන්, කෘෂිකාර්මික වැඩසටහන්, ක්‍රීඩා වැඩසටහන්, ළමා වැඩසටහන්, කාන්තා වැඩසටහන් වශයෙනි.

ගුවන්විදුලියෙන් විකාශය වන වැඩසටහන්වල පහත සඳහන් නිර්මාණාත්මක ලක්ෂණ හඳුනාගත හැකිය. සරල බව, එක්වරකින් තේරුම් ගැනිමට හැකිවිම, සවන කේන්ද්‍රීය එළඹුම, දිගු සංකිර්ණ වාක්‍ය යොදා නොගැනීම, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට අවකාශ සැලසිම, ඉලක්ක ග්‍රාහක අත්දැකිම් පසුතලයට ආමන්ත්‍රණය කිරිම.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

ගුවන්විදුලියේ ප්‍රධානතම නිර්මාණාත්මක කාර්යය වන්නේ ශ්‍රාවකයාගේ මනසේ චිත්ත රූප මැවෙන ආකාරයෙන් බස හැසිරවිමයි.

ගුවන්විදුලි නිවේදකයන් නාට්‍ය ඉදිරිපත් කරන ශිල්පින් කථකයන් ග්‍රාහකයා ආකර්ෂණය කරන්නේ ස්වීය හඬ භාවිතය මගිනි. එහිදි වැඩසටහනේ අවශ්‍යතාවයට යෝග්‍ය වන ලෙස සුදුසු ලෙස නිර්මාණශිලිව හඬ භාවිතා කළ යුතුය. කටහඬෙහි මදුර බව, තිව්‍රබව, පැහැදිලිබව, නිරවුල් බව, උච්චාරණය කිරීමේ හැකියාව වැදගත් වේ. එමෙන්ම උචිත වාක්සංයමය පුහුණු කළ යුතුය.

ගුවන්විදුලියේ ආකර්ශනීය වැඩසටහන් වර්ගයක් වශයෙන් ගුවන්විදුලි නාට්‍ය දැක්විය හැකිය. ගුවන්විදුලි නාට්‍ය පරිකල්පනය පදනම් වූ නිර්මාණයකි. ගුවන්විදුලි නාට්‍යයක් රචනා කිරිම සිදු වන්නේ ශ්‍රාවකයාට පරිකල්පනය කළ හැකි වන ලෙසිනි. අසන්නා ගුවන්විදුලි නාට්‍ය රස විඳින්නේ තමාගේ පරිකල්පනයෙහි මවාගත් චිත්ත රූප සමගයි. එය ශ්‍රාවකයාට පරිකල්පනය කළ හැකි අයුරින් නිෂ්පාදනය කළ යුතුය.
ශබ්ද භාවිතයේ දි හඬෙහි උච්චරණය, හැගිම් හා භාව කථනය, ළයාන්විත බව සහ සුහද බව රැක ගැනිම නිර්මාණය කෙරෙහි ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනිමට හේතුවේ.

ගුවන්විදුලියේ නිර්මාණශීලිත්වය පැහැදිලි වන තවත් අවස්ථා කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

## සංගීතය

ගුවන්විදුලියේ නිර්මාණාත්මක භාෂා මාධ්‍යයක් වශයෙන් සංගිතය දැක්විය හැකිය. ශ්‍රාවකයා තුළ චිත්ත රූප මැවිම සදහා සංගිතය භාවිතා කරයි.

උදා: බටනලා වාදනයක් මගින් ඈත ගම්මානයක් අසිරිය ශ්‍රාවකයාගේ සිතෙහි ඇති කිරිම.

දුක, කදුල, සිනහව, වේදනාව, ත්‍රා,සය භිතිය වැනි භාවයන් ඇති කිරිම සදහා සංගිතය භාවිතා කරයි.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## නිහඬතාව

ගුවන්විදුගියේ නාට්‍ය සහ වෙනත් විනෝදාත්මක වැඩසටහන් වලදී නිර්මාණශිලි ලෙස නිහඬතාව භාවිතා කරයි. වැඩසටහන් දෙකක් අතර කාලය, විරාමය, සනිටුවහන් කිරීමට, හාස්‍ය, පුළුල්බව දැක්වීම සදහා හඬ සමග නිහඬතාව භාවිතා කරයි.

## පුනරුක්තිය

ගුවන්විදුලි භාෂාවේ වඩාත් නිර්මාණශිලි ලෙස පුනරුක්තිය භාවිතා කළ හැකිය. යම් වචනයක් නැවැත නැවැත කිම පුනරුක්තිය වශයෙන් හැදින්විය හැකිය. ගුවන්විදුලි වෙළදදැන්විම් වලදී පුනරුක්තිය බහුල වශයෙන් භාවිතා කරයි.

මෙයට අමතරව නිර්මාණශිලිව හඩ භාවිතා වන අවස්ථාවන් ලෙස අංක භාවිතා කිරිමේ දි එය වචන වලින් ප්‍රකාශ කිරිම.උදා: 9.30 පැවැසීමේ දී නවය පසුව් විනාඩි තිහයි. දිනයන් දැක්විමේ දි ඊයේ පෙරේදා වශයෙන් දැක්විම සදහන් කළ හැකිය.

## රූපවාහිනී මාධ්‍ය.

රූපවාහිනිය ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන මාධ්‍යයකි. රූපවාහිනිය ගුවන්විදුලියේ දිගුවක් ලෙස ද හැදින්විය හැකිය. එමෙන්ම ශබ්දයට ද ප්‍රමුඛස්ථානයක් ලබා දේ. රූපවාහිනී තිරයේ ප්‍රමාණය කුඩා බැවින් එය කලා මාධ්‍යයක් වශයෙන් ද නොසලැකේ. නමුත් මෙය පවුලේ සියලුම දෙනාමට ආමන්ත්‍රණය කරන පොදු මාධ්‍යයක් වශයෙන් හැදින් විය හැකිය.

රූපවාහිනිය සම්භාව්‍ය කලාවට එතරම් අවකාශයක් ලබා නොදෙන අතර මෙම මාධ්‍ය සැලැකෙන්නේ **Glamorous** මාධ්‍යයක් වශයෙනි. මෙම මාධ්‍ය අලංකාරික, ජනප්‍රිය, නිර්මාණාත්මක ගුණාංග මත රදා පවතියි. එහි ලා ප්‍රධාන වශයෙන් නව්‍යතාව, සපලදායී හා අපූර්වවීම අදහස් වේ. එසේම නිර්මාණශිලිත්වය හා බලපෑම, පිරිවැය, ඵලදායි තෝරා ගැනිම හා නම්‍යශිලි භාවය වැනි සාධක කෙරිහිද අවධානය යොමු කළ යුතුය. වැඩසටහන්වල ගුණාත්මක බව හා නිර්මාණාත්මක භාවිතය අධ්‍යයනයෙන් හදුනා ගත යුතුය.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

රූපවාහිනියෙන් විකාශය වන වැඩසටහන් ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට බෙදා දැක්විය හැකිය.

- වෘත්තාන්ත
- වෘත්තාන්ත නොවන

වෘත්තාන්ත වැඩසටහන් වලට නිදසුන් ලෙස ටෙලිනාට්‍ය, ටෙලි චිත්‍රපට, කතන්තර, කාටූන් දැක්විය හැකිය.

වෘතාන්ත නොවන වැඩසටහන් ලෙස ප්‍රවෘත්ති, වාර්තා දැක්විය හැකිය.

විවිධ ක්ෂේත්‍ර අනුවද රූපවාහිනයේ විකාශය වන වැඩසටහන් (ප්‍රවර්ග) හදුනාගත හැකිය. ළමා,කාන්තා, ක්‍රීඩා, චාරිකා, කාලීන, ජෝතිශ්‍ය වශයෙන් ද වර්ග කළ හැකිය.

රූපවාහිනියේ ජනප්‍රිය අංගයක් වශයෙන් ටෙලිනාට්‍ය දැක්විය හැකිය. ජනප්‍රිය ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කිරිම සඳහා ප්‍රස්තුතය හඳුනා ගැනිම, චරිත නිරූපනය, පිටපත

හා කතන්දරයේ ගලා යාම, ගැටුම් හා කුතුහලය දැනවීම, ශබ්ද සංවාද හා සංගීතය නිර්මාණාත්මකව හා අර්ථ පූර්වකව ගොඩනගා ගැනීම වැදගත් වේ.

රූපවාහිනී ටෙලිනාට්‍යයක් නිර්මාණය කිරීම පසුපස විශාල තාක්ෂණික කාර්යයක් පවතී. එමෙන්ම විශාල පිරිසක්ද සහභාගී වේ. කැමරා අධ්‍යක්ෂ, කලා අධ්‍යක්ෂ, සහය අධ්‍යක්ෂ, නිෂ්පාදක, කළමනාකරු, නළු නිලියන්, පටිගත කිරීමේ ශිල්පීන්, වේෂ නිරූපන ශිල්පීන්, සංස්කරණ ශිල්පීන්, සංගීත අධ්‍යක්ෂවරුන්, සජීවී කරන ශිල්පීන් වැනි ශිල්පීන් රාශියක් සහභාගී වේ.

රූපවාහිනී මාධ්‍යයේ ඇති නිර්මාණාත්මක අංගයක් වන්නේ රූපවාහිනී රචනයයි. ශ්‍රව්‍ය දෘශ්‍ය කුසලතා රැකෙන අයුරින් රූපවාහිනී තිරරචනය කිරීම වැදගත්වේ. එනම් රූපවාහිනී ටෙලිනාට්‍යයක් සඳහා තිර රචනයේ යෙදීමයි. තිර පිටපතේ නිර්මාණශීලිත්වය මත කථාවේ උසස් බව සුරැකේ.

රූපවාහිනි නිර්මාණ කාර්යය මෙහිදී වැදගත්වේ. රූපවාහිනී නිර්මානකාර්යයේ දී කැමරා ශිල්ප ක්‍රම භාවිතය, ආලෝකකරණය, රංග නිරූපනය, සංස්කරණය, ශබ්ද ආදිය භාවිතා කරයි. කෙසේ වෙතත් මේ සියල්ලම සඳහා නිර්මානකරුගේ හැකියාව වැදගත්වේ. ටෙලිනාට්‍ය, සම්මුඛ සාකච්ඡා, සජීවි වැඩසටහන් වලදී භාවිතා කරනු ලබන ආලෝකකරණය, කැමරාකෝණ, වේෂ නිරූපණය මත එම වැඩසටහනේ නිර්මානශීලීත්වය වර්ධනය වේ. එමෙන්ම වැඩසටහන සඳහා යොදා ගන්නා තාක්ෂණික ප්‍රයෝග මෙහිලා වැදගත් වේ. වර්තමානයේ පරිගණක තාක්ෂණය රූපවාහිනී නිර්මාණ කාර්යය සඳහා යොදා ගැනේ.

## සිනමාවේ නිර්මාණාත්මක ලක්ෂණ.

සිනමාව ජනප්‍රිය ශ්‍රව්‍ය දෘශ්‍ය කලා මාධ්‍යයකි. මෙය අනෙකුත් මාධ්‍ය වලට සාපේක්ෂව සජීවීබවෙන් ඉහලය. එම මාධ්‍යයට විශේෂිත භාෂාවක් හා ව්‍යාකරණයක් වර්ධනය වී තිබේ. චිත්‍රපට ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයක් යටතේ වර්ග කළ හැකිය. එසේ වර්ගීකරණය කිරීම සිනමා ප්‍රවර්ග වශයෙන් හැඳින්වේ.

- ක්‍රියාකාරී චිත්‍රපට
- වික්‍රමාන්විත චිත්‍රපට
- ග්‍රැෆික් චිත්‍රපට
- චරිතාපදාන චිත්‍රපට
- කාටූන් චිත්‍රපට



...maraweera
...sity of J'Pura, MA & M.Phil in
...University of Kelaniya.
...ting Lecturer,

- හාස්‍යෝත්පාදක චිත්‍රපට
- වාර්තා චිත්‍රපට
- ත්‍රාසයජනක චිත්‍රපට
- ප්‍රේමාන්විත චිත්‍රපට
- සංගිතමය චිත්‍රපට
- විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපට
- යුද්ධ චිත්‍රපට

ඇතැමුන්ගේ අදහසට අනුව චිත්‍රපට ප්‍රධාන වශයෙන් ජනප්‍රිය හා සම්භව්‍ය වශයෙන් වර්ග කළ හැකිය. නමුත් මෙසේ වර්ගීකරණය කිරීම යෝග්‍ය නොවන බව බොහෝ විද්වතුන්ගේ අදහසයි.

සිනමාවේ නිර්මාණාත්මක ලක්ෂණ විමසීමේ දී චිත්‍රපට නැරඹීම, අන්තර්ගතය විශ්ලේෂණය කිරීම, තාක්ෂණික අංග පිළිබඳව විශ්ලේෂණය හා භාවිත හැකියා වර්ධනය කර ගැනිම නිර්මාණාත්මක භාවිතය වැදගත් වේ. එමෙන්ම චිත්‍රපට නිෂ්පාදනයේ දි පූර්ව නිෂ්පාදන පසු නිෂ්පාදන අවධි වටහා ගැනිම වැදගත්වේ.

සිනමාපට අධ්‍යයනය කිරීමේ දී විශේෂයෙන්ම චිත්‍රපටියේ තිර රචනය, අධ්‍යක්ෂණය, සිනමා තාක්ෂණය, සංස්කරණය වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරිම වැදගත් වේ.

සිනමාවේ නිර්මාණාත්මක ප්‍රවේශ ගණනාවක් පවතී. එසේ පවතින නිර්මාණාත්මක ප්‍රවේශ ලෙස සිනමානාත්ම,ක චලචින්දන, ශබ්ද චින්දන, කාලින, නාට්‍යමය, සිනමා නිර්මිත වැනි ක්ෂේත්‍ර වැදගත්වේ.

චිත්‍රපටියක් නිෂ්පාදනයේ දී තිර රචනය වැදගත්වේ. තිර රචනයේ දී දෘශ්‍ය මෝස්තරය, රූපක, සංකේත යන ආදී උපක්‍රම භාවිතා කෙරේ.

සිනමාවේ නිර්මාණශීලීත්වය ඉස්මතු කරන අංග ලෙස රංගනය, පසුතල නිර්මාණය, ඇඳුම්පැලැඳුම් හා වේශ නිරූපනය, කැමරා කරණය සංස්කරණය, ශබ්ද හා සංගීත සංයෝජනය දැක්විය හැකිය.

## රූපවාහිනීය සහ  සිනමාව තුළ භාවිතා කරන කැමරා කෝණ
## (කැමරා ශිල්ප ක්‍රම)

**සමීප රූපය(Close  Up –CU)**



**මෙහිදී පුද්ගලයකුගේ උරහිසෙන් ඉහල කොටස දැක්වේ. පුද්ගලයකුගේ භාවයන් දැක්වීමේ දී මෙම රූපය භාවිතා කළ හැකිය. උදා: දුක, සතුට, වේදනාව, භීතිය දැක්වීමේ දී මෙම රූප රාමුව භාවිතා කරයි. සම්මුඛ සාකච්ඡා වලදී, ප්‍රවෘත්ති කියන විටදි ආගමික අනුශාසනා වලදී මෙම රූප රාමුව භාවිතා කරයි.**

**ඉතා සමීප රූපය (Big Close Up – CU)**



**පුද්ගලයකුගේ නලලේ සිට නිකට දක්වා වන ප්‍රදේශය ආවරණය වන පරිදි හසු කර ගන්නා රූපය වේ. මෙමගින් පුද්ගලයකුගේ භාවයන් එයට දක්වන ප්‍රතිචාර විරෝධය, මානසික කායික ආතතිය යන ආදී ලක්ෂණ ඉතාමත්ම සියුම්ව නිරීක්ෂණය කළ හැකිය. විශේෂයෙන්ම ටෙලි නාට්‍ය,  චිත්‍රපට වල සංවේදී අවස්ථා නිරූපනය කිරීම සඳහා මෙම රූප රාමු  භාවිත කරයි.**

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## <u>අතිසමීප රූපය ( Extreme Close Up – CU)</u>



පුද්ගලයකුගේ හෝ වස්තුවක යම් කොටසක් ශරීරයේ යම් අංගයක් විශාල කොට දැක්වීම සදහා මෙම රූපය යොදා ගැනේ. රූපවාහිනී සම්මුඛ සාකච්ඡා වලදී අදහස් දක්වන විට අංග චලනය වන ආකාරය මෙමගින් දැක්විය හැකිය. උදා: ටෙලිනාට්‍යයක දී නිලියකගේ ඇසින් කදුළු ගලන ආකාරය පෙන්වීමට මෙම රූපය යොදා ගැනීම නිදසුනක් ලෙසට දැක්විය හැකිය.

## <u>මධ්‍යම රූපය ( Medium Shot – MS)</u>



පුද්ගලයකු සිට ගෙන සිටින විට ඉනෙන් ඉහල කොටස ආවරණය වන ආකාරයට රූපය හසු කර ගනියි. මෙහිදී අත්වලින් කරනු ලබන ප්‍රකාශයන්, ඉරියව් පිළිබිඹු වේ.

## <u>මධ්‍යම සමීප රූපය (Medium lose Up – MCU)</u>



**පුද්ගලයකුගේ පපු ප්‍රදේශයෙන් උඩු කය කොටස ආවරණය වන ආකාරයට හසුකරගන්නා රූපය. රූපවාහිනී මාධ්‍යයේ දී පුද්ගලයන් දෙනෙනෙකු අතර ඇතිවන සංවාදයන් පෙන්වීම සඳහා මෙම රූපය යොදා ගත හැකිය.**

## <u>මධ්‍යම දුර රූපය(Medium Long Shot – MLS)</u>



**පුද්ගලයකු සිටගෙන සිටින විට ඔහුගේ දනහිස ප්‍රමාණයෙන් ඉහල ප්‍රදේශය හසුවනසේ ගනු ලබන රූපයයි. බොහෝ විට ඇතැම් සමාජීය තේමාවන් රූගත් වාර්තා චිත්‍රපට තුළ සමාජයේ පුද්ගලයන්ගේ අවධානය යොමු කර ගැනිම සඳහා මෙම රූපය භාවිතා කරයි.**

## අතිදුර රූපය( Extreme Long Shot – ELS)



කැමරාවට හසුකර ගන්නා වස්තුවේ සිට හැකි තරම් දුරින් හසු කර ගන්නා රූපයයි. මෙහිදී වස්තුවේ ස්වරූපය පැහැදිලිව දිස් නොවේ. උදා: ඈත කදු අතරින් තිතක් ලෙස පැමිණෙන පුද්ගලයෙකු දැක්විය හැකිය.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## ඉතා දුර රූපය ( Very Long Shot – VLS )



කැමරාවට ඉලක්ක කර ගන්නා වස්තුව පැහැදිලිව පෙනෙන පරිදි හසු කර ගන්නා රූපය. උදා: සරත් යතුරු පැදියක් නැගී පැමිණෙමින් සිටී. ඔහු නිල් පැහැති හෙල්ටමයක් හා කළු පැහැති ඇඳුමකින් සැරසී සිටී.

## <u>දුර රූපය(Long Shot – LS)</u>



පුද්ගලයකු සිටගෙන සිටින විට ඔහුගේ සම්පූර්ණ රූපය ආවරණය වන පරිදි ලබා ගන්නා රූපය.

## <u>සංස්ථාපන රූපය (Establishing Shot)</u>



යම් සිදුවීම් පෙළක ආරම්භය සිදුවන ස්ථානය පසුබිම පිළිබඳව ප්‍රේක්ෂකයාට අවබෝධයක් ලබා දීමට මෙම රූය භාවිතා කරයි. උදා: චිත්‍රපටියක් ආරම්භයේ දී මෙම රූපය යොදා ගනු ලබයි.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## මධ්‍යම සමීප රූපය - උඩුකුරු දැක්ම ( Medium Close up – Low Angle)



මෙහිදි කැමරාව වස්තුවට පහල සිට එල්ල කොට ගනු ලබන රූපය යම් පුද්ගලයකුගේ උදාරත්වය, උසස්කම, බලය දැනවීම සදහා මෙම රූපය භාවිතා කරයි. එමෙන්ම චරිතයේ ප්‍රබල බව ප්‍රේක්ෂකයාට ඒත්තු ගැන්වීම සදහා මෙම රූපය භාවිතා කරයි.

## දුර රූපය - උඩුකුරු දැක්ම (Long Shot – High Angle)



මෙහිදී කැමරාව වස්තුවට ඉහලින් එල්ල කොට රූප ගණු ලැබේ. පුද්ගලයකුගේ හෝ වස්තුවක දුර්වලකම, හීනපෞරුෂත්වය, භීතිය දැනවීම සඳහා භාවිතා කරයි.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## කැමරා ශිල්ප ක්‍රම - කැමරා චලන

විවිධ කැමරා කෝණ වලින් මෙන්ම කැමරා චලන මගින් ද නිර්මාණාත්මකව සන්දේශයක් ඉදිරිපත් කළ හැකිය. කැමරාව චලනය කරමින් ලබා ගන්නා රූප රාමු වල නිර්මාණශීලිත්වයක් පවතී. එසේ කැමරාව චලනය කරන ක්‍රමවේද දෙකක් පවතී.

- කැමරාව තිරස්ව වමට හෝ දකුණට ගෙනයාම හෝ කැරකවීම **Panning** නම් වේ.
- කැමරාව උඩට පහලට කිරීම මගින් රූප සටහන් කර ගැනීම **Tilting** නම් වේ.

### කැමරාව තිරස්ව වමට හෝ දකුණට ගෙනයාම හෝ කැරකවීම (Panning)

මෙහිදී කැමරාව එකම ස්ථානයේ තබා වේගයෙන් හෝ සෙමින් දෙපසට ගමන් කරවයි. චලනය වන වස්තුවක් හෝ පුද්ගලයකු හසුකර ගැනීම සඳහා මෙම ක්‍රමය භාවිතා කරයි. එමෙන්ම දුර රූපයකින් විශාල ප්‍රදේශයක් පෙන්වීම සඳහා මෙම ක්‍රමවේදය භාවිතා කරයි. යම් සිදුවීමක් සිදුවීමට යන ස්ථානය පිළිබඳව ප්‍රේක්ෂකයාට අවබෝධයක් ලබා දීමට මෙම රූපය භාවිතා කරයි.

### කැමරාව උඩට පහලට කිරීම මගින් රූප සටහන් කර ගැනීම (Tilting).

මෙහිදී යම් වස්තුවකට කැමරාව එල්ල කොට උඩට පහලට චලනය කරනු ලැබේ. යම් පුද්ගලයකු වස්තුවක් පිළිබඳව වඩාත් අවධාරණය කර දැක්වීමට මෙම ක්‍රමවේදය භාවිතා කරයි.

## රංග භූමි

මානවයා ඉතා ඈත අතීතයේ සිටම විවිධ අරමුණු උදෙසා රංග කාර්යයේ නිරත විය. ලෙඩ රෝග සුවකර ගැනීමට, වැස්ස ලබා ගැනීමට, අධ්‍යාත්මික සුවතාවය සඳහා විවිධ රංගන ක්‍රමවේදයන් භාවිතා කළේය. රංග කාර්යය සඳහා රංග භූමි අවශ්‍ය වේ. ඒ ඒ අවශ්‍යතාවයේ ස්වරූපය අනුව රංග භූමි නිර්මාණය කර ගත යුතුය. කෝලම්, සොකරි වැනි රංග කාර්යවලදී ඊට උචිත ලෙස රංග භූමි සකස් කර ගත යුතුය.

වේදිකා නාට්‍යයක් රංග දැක්වීමේ දී ඊට උචිත ලෙස රංග භූමිය සකස් කර ගැනීම වැදගත් වේ. විදි නාට්‍ය වලදී භාවිතා කරන රංග භූමි වල ස්වරූපය වාඩාත් වෙනස් වේ.

රංග කලාව වසර දහස් ගණනක් තිස්සේ මානව ප්‍රකාශනය, ගවේශණය උදෙසා ප්‍රබල මාධ්‍යයක් ලෙස පැවැති එන්නකි. රංග කලාව සාමූහික කලාවකි. එය මානවයා ස්වකීය විනෝදය, උපදේශනය, චිකිත්සාව උදෙසා භාවිතා කරයි.

රංග භූමිය හා රංග කලාව සහයෝගිතා කලාවකි. මෙමගින් අන්තර් පුද්ගල චින්තනය හා ව්‍යවහාරික කුසලතා පෝෂණය කර ගැනීම පිණිස මග පෙන්වයි.

රංග භූමිය හා රංග කලාව හඳුනා ගැනීම, රංග භූමි ශිල්පය, වේදිකා පරිපාලනය, වේදිකා ආලෝකකරණය, රංග වස්ත්‍රාභරණ, වේෂ නිරූපණය, රංගනය, සංගීතය, නාට්‍ය ප්‍රභේද රංග භූමි නිෂ්පාදනය වැනි ක්ෂේත්‍ර හඳුනා ගැනීම වැදගත් වේ.

රංග භූමිය යනු නිර්මාණාත්මක ස්ථානයකි. රංග භූමියක් නිර්මාණය කිරිම සඳහා සාමූහික සහභාගිත්වයක් අවශ්‍ය වේ. එමෙන්ම මෙය දුෂ්කර ව්‍යායාමයකි.

ප්‍රධාන වශයෙන් රංග කලාවේ මූලිකාංග කිහිපයක් හඳුනාගත හැකිය.

- සාහිත්‍ය මූලිකාංග
- තාක්ෂණික මූලිකාංග
- ප්‍රසාංගික මූලිකාංග

## සාහිත්‍ය මූලිකාංග

සාහිත්‍ය මූලිකාංග යටතේ ප්‍රස්තුතය කතා වස්තුව හා එහි ආකෘතිය උච්චස්ථාන

(මූල මැද අග) චරිත විවරණය, භාෂාව, ශෛලිය ඒකපාත්‍ර භාෂණය වැදගත් වේ.

## තාක්ෂණික මූලිකාංග

මේ යටතේ ජවනිකා, ඇඳුම්පැලඳුම්, රංග භාණ්ඩ, අලෝකය, ශබ්ද, වේෂ නිරූපනය හා නිෂ්පාදනය දැක්විය හැකිය.

## <u>ප්‍රසාංගික මූලිකාංග</u>

**මේ යටතේ රංගනය, චරිත, අභප්‍රේරණ චරිත විශ්ලේෂණය සහවේදනය කථනය ශ්වාස සංසමය, වාචික ප්‍රකාශනය, ආවර්ජනය කථන ප්‍රක්ෂේපණය, කථන ශෛලිය හා වාග්ව්‍යවහාරය, අභිනය, කායික භාෂාව, මුහුණේ ප්‍රකාශනය, චලන රංග කාර්යයන්**

**( වේදිකා නාට්‍යයක්, සැනකෙලියක්, සංගිත ප්‍රසංගයක්) සංවිධානය කිරිම අතිශ්‍ය සංකිර්ණ ව්‍යායාමයකි. මෙය අදියර කිහිපයක් ඔස්සේ පැහැදිලි කල හැකිය.**

- **ප්‍රථමයෙන් සංකල්පනාව තේමාව අදහස් නිර්මාණාත්මකව සකස් කර ගැනීම වැදගත් වේ.**

- **දෙවනුව එම සංකල්පනාව ක්‍රියාවක් හෝ කථා වස්තුවක් බවට පත් කර ගත යුතුය. මේ සඳහා පරිකල්පන ශක්තිය හා නිර්මාණාත්මක ප්‍රවේශය වැදගත් වේ.**

- **තෙවනුව අදාල නිර්මාණාත්මක කාර්යය සඳහා චරිත තෝරාගත යුතුය. චරිත තෝරා ගැනිම් දී චරිත වල පෞරුෂත්වය, වයස, පෙනුම, විශ්වාසය, සමාජ පසුබිම, භෂා භාවිතය පිළිබඳව සැලැකිලිමත් විය යුතුය**

- **හතර වෙනුව රංග සභාව වැදගත් වේ. මේ යටතේ රංගන ශිල්පියාගේ භාෂා උච්චරණය, ප්‍රකාශන ශෛලි,ය සංවාද ඒකපාත්‍ර භාෂණය ආදිය නිර්මාණාත්මකව ගොඩ නැගිය යුතුය.**

- **පස්වනුව අදාල රංග කාර්යය සඳහා සංගීත සංයෝජනය, රිද්මය, ස්වර රචනය, හඬ හා ගීත යන ආදිය ගොඩ නැගිය යුතුය.**

- **සයවනුව ප්‍රේක්ෂාව වැදගත් වේ. ප්‍රේක්ෂාව යන්නෙන් අදහස් කරන්නේ ප්‍රේක්ෂකයා ඉදිරියේ වේදිකාව මත මවන දෘශ්‍ය ප්‍රකාශනයේ ප්‍රබලතාවයයි. නොවසේ නම් නාට්‍යමය ප්‍රයෝග ඇසුරින් මවන ප්‍රාසාංගික දැක්මයි.**

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

## 7.4 සන්දේශයක් නිර්මාණශීලිව ගොඩනැගීමට ජනශ්‍රැතිය හා ජනකලා භාවිතා කළ හැකි ආකාරය.

අතිතයේ සිට මුඛ පරම්පරාවෙන් සහ මනුෂ්‍ය චර්යාවෙන් පැවැත එන පුරාවෘත්ත සුරංගනා කථා කවිකථා කෙළි සෙල්ලම් ජන ශ්‍රැතිය ලෙස හැදින්විය හැකිය.

ජනශ්‍රැතිය එක් එක් සමාජ වලට උරුම වූ එම සමාජයේ ආවේනික ලක්ෂණ සමග බැදි පවතී. ජනශ්‍රැති අංග මුඛ පරම්පරාවෙන් පැවැත එන අංග ලෙසට හැදින්විය හැකිය. සමාජය සහ එහි ක්‍රියාකාරකම් සමග ජනශ්‍රැතිය දැඩි ලෙස බැදි බද්ධ වි තිබේ.

ජන ශ්‍රැතිය පිළිබදව විමසිමේ දි එහි ප්‍රභේද හඳුනා ගැනිම වැදගත් වේ. ජනශ්‍රැතියේ ප්‍රභේද පහත පරිදි දැක්විය හැකිය.

<u>ජනකථා</u>

උදා: අන්දරේගේ කතාව. මහදැන මුත්තාගේ කථාව

<u>ජන නාට්‍ය</u>

උදා: උඩරට සොකරි, පහත රට සොකරි

<u>ජන ක්‍රිඩා</u>

උදා: ඔලිද කෙළය, පංච කෙළිය, පොපොල් ගැසිම

<u>ජන ගායනා හා ජන කවි</u>

උදා, ගැල් කවි, පැල් කවි, පතල් කවි, පාරු කවි

<u>ජන ඇදැහිලි හා විශ්වාස</u>

උදා: පත්තිනි, ගම්භාර, අයියනායක යන දේව ඇදහිලි.

ජනශ්‍රැති පිළිබදව විවිධ නිර්වචන ඉදිරිපත් කර තිබේ. ඒවා පිළිබදව අවධානය යොමු කිරිම වැදගත් වේ.

සන්නිවේදන ශබ්දාකරයේ සුනන්ද මහේද්‍ර මහතා ජනශ්‍රැති නිර්වචනය කොට ඇත්තේ ජන සමාජවල ප්‍රාථමික අවශ්‍යතා සපුරා ලනු සදහා බිහිවු ජනකතා ජනකවිය ජනක්‍රිඩා ජන

ඇදහිලි ජන විශ්වාස ජනප්‍රවාද පුරාණොක්ති යන ආදිය අධ්‍යයනය කිරිම සදහා වෙන්වූ විෂයයි ලෙසයි.

නන්දසේන රත්නපාල මහතා ජනශ්‍රැති විද්‍යාව නැමැති ග්‍රන්තයේ දක්වා ඇත්තේ ජනශ්‍රැති යනු ප්‍රාථමික හෝ සංකිර්ණ බවට පත් නුතන හෝ ජන සමුහයක් අතර කාලයක් තිස්සේ මුඛපරම්පරා ගතව සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ ඥාන සම්භාරය යනුවෙනි.

සිරි ලියනගේ මහතා ජනශ්‍රැති ශබ්දකෝෂයෙහි දක්වා ඇත්තේ ජනශ්‍රැති යන පදයෙන් අදහස් කෙරෙන්නේ කිසියම් ජන කොට්ඨාසයක් අතර මුඛපරම්පරාගත ව එන ව්‍යවහාර සමුච්චයයි.ජනකතා ජනකවි ජන කියමන් ද හැදින්වෙන්නේ ජනශ්‍රැති යන නමිනි. මෙය ඉංග්‍රිසියෙන් හැදින්වෙන්නේ **Folklore** යනුවෙනි.

ජනශ්‍රැති පිළිබදව තවදුරටත් විමසිමේ දි පැහැදිලි වන්නේ ජනශ්‍රැතිය යනු මුඛ පරම්පරාගතව කාලයක් තිස්සේ පැවැත එන සාම්ප්‍රදායික ඥාන දායාදයකි. කිසියම් පුද්ගලයකුට බිහි කල ජනශ්‍රැතියක් සමුහ පිළිගැනිමට ලක්වන්නේ එය ඒ සමාජ විඥානයට අනුරුපවිම නිසාය. මෙය ජනශ්‍රැතියේ සාමුහික උපත පිළිබදව සිද්ධාන්තයයි.

සමුහික විඥනය යනු සමුහයන් අතර පවත්නා එකගවිම ප්‍රතික්ෂේපවිම පිළිගැනිම විරෝධය ඇතුළු ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පොදු පිළිගැනිමට ලක්වූ සිතිවිලි සමුදාය වේ.  මෙය ජනයාගේ ඥානය ලෙස අර්ථ දැක්විය හැකිය. එනම් ජනශ්‍රැතිය යනු අතිත ජනයාගේ ඥානය ලෙස වර්ධනය වුවකි.

ජනශ්‍රැති නිර්මාණශිලි බවෙන් යුක්ත වේ. එමෙන්ම ජනශ්‍රැති ආශ්‍රය කර ගනිමින් නිර්මාණ ගොඩ නැගිය හැකිය.

ජනශ්‍රැති පිළිබදව විමසිමේ දි ජන උරුමය වැදගත් වේ. ජනශ්‍රැති ජනකලා ජනකවි ජනගිත ජනවිශ්වාස ඇදහිලි අභිචාරවිධි චාරිත්‍රවාරිත්‍ර තේරවිලි උපමා ප්‍රස්තාව පිරුළු අධිවිශ්වාස ජනවෙදකම කෙම්ක්‍රම ජනසංගිතය ජනක්‍රිඩා ජනඋත්සව වෘක්ෂශ්‍රැති සත්ත්ව ශ්‍රැති යාතු කර්ම විශ්වාස සෘතු කර්ම විශ්වාස ඇතුළු පාරම්පරික දැනුමේ සමස්තයෙන් ජන උරුමය සැදි තිබේ. එමනිසා ජනශ්‍රැති පාරම්පරික ඥාන සම්භාරයක් ලෙස හැදින්විය හැකිය.

ජනශ්‍රැති පිළිබදව ජනයා තුල විශ්වසනියත්වයක් ගොඩනැගෙන්නේ ඒවා ඉතිහාසය සහ ආගම සමග බද්ධ විම හේතුවෙනි. එමෙන්ම ජනශ්‍රැතිය සංස්කෘතිය කෘෂිකර්මාන්තය විවිධ ජිවන ක්‍රම හා මානව විද්‍යාව ජිව විද්‍යාව ඇතුළු විෂය හා ක්‍රියාකාරකම් සමග බැදි පවති.

ජනශ්‍රැති පිළිබදව විග්‍රහ කිරිමේ දි එය මානව ජිවිතය මිනස්කමේ මහිමය ආශ්චර්ය හා අද්භූත බව හා බැදි පවති.

ජනශ්‍රැතිය පිළිබඳව විමසීමේ දී සංස්කෘතිය වැදගත් වේ. සංස්කෘතිය මූලික වශයෙන් භෞතික සහ අභෞතික ලෙස වර්ග කළ හැකිය. මිනිසා විසින් නිපදවාගත් සංස්කෘතියේ භෞතික නොවන කොටස අස්පර්ශ සංස්කෘතිය යනුවෙන් හැඳින් වේ. භෞතික සංස්කෘතික අංග නිර්මාණය සඳහා පාදක වූ දැනුම ඒ හා සබැඳි කුසලතා ආකල්ප සිරිත් විරිත් ඇවැතුම් පැවැතුම් විශ්වාස ඇදහිලි තාක්ෂණය කලා සාහිත්‍ය අස්පර්ශ සංස්කෘතිය වශයෙන් හැඳින්විය හැකිය.

සන්නිවේදන කාර්යයේ දී විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය සන්දේශ නිර්මාණශීලීව සකස් කිරිම සඳහා ජනශ්‍රැති හා ජනකලා භාවිතා කළ හැකිය.

ජනශ්‍රැතිය සත්‍ය හෝ මිථ්‍යාව වශයෙන් පැවැතිය හැකිය. මෙහි බොහෝ අංග නූතන නිර්මාණ සඳහා උපයෝගී කර ගනු ලැබේ. දැන්වීම් නිර්මාණයට ටෙලිනාට්‍ය නිර්මාණයට චිත්‍රපට නිර්මාණයට ගීත නිර්මාණයට කවි නිර්මාණයට නව කතා කෙටි කතා නිර්මාණයට ජනශ්‍රැති යොදා ගනු ලැබේ.

1972 දී යුනෙස්කෝ ආයතනය අස්පර්ශ කලා උරුම හා ජනකලා සංරක්ෂණයට ප්‍රතිපත්ති හා නිති සම්පාදනය කලේය. 2011 වන විට රාජ්‍ය 153ක සංරක්ෂණය කල යුතු උරුම 911ක් හඳුනා ගෙන ප්‍රකාශයට පත් කර තිබුණි. 2018 වසරේ දී අම්බලන්ගොඩ නූල් රූකඩ කලාව ශ්‍රී ලංකාවේ මුල් වරට සංරක්ෂිත අස්පර්ශ්‍ය උරුමයක් ලෙස යුනෙස්කෝ නියෝජන ලැයිස්තුවට ඇතුලත් කරිනි.

1960 දශකය වන විට ජනශ්‍රැතිය බොහොමයක් ඇමරිකානු ජන සමාජ ආශ්‍රිත ගැටලු විසඳා ගැනිමට යොදා ගනු ලැබිය. නගර සැලසුම්කරණය වයස්ගතවීම ආර්ථික සංවර්ධනය බහු සංස්කෘතික අධ්‍යයනය සංරක්ෂණය වෛද්‍ය විද්‍යාව මහජන සෞඛ්‍ය යන අංග සඳහා ජනශ්‍රැතිය යොදා ගෙන තිබේ.

## ජනකලා භාවිතය.

ජනකලා යනු මුල් මානව ගෝත්‍රික සමාජවල උපත ලබා වර්ධනය වී පැවැත එන්නකි. ජනකලා සහ ජනශ්‍රැති අතර සමීප සබඳතාවයක් පවති. මෙය ජනයා අතර පිළිගැනිමට ලක්වෙමින් පරපුරෙන් පරපුරට ගමන් කරන කලා මාධ්‍යයකි. ජනකලා ජන අත්දැකීම් වලට අනුගතව ගොඩ නැගේ.

ජන කලා සඳහා නිදසුන් ලෙස සාම්ප්‍රදායික චිත්‍ර, මූර්ති, බිරලු, පැදුරුවිවීම්, කැටයම්, බලි, ශාන්තිකර්ම නිර්මාණය, සාම්ප්‍රදායික අත්කම් මෙන්ම වාචික සාම්ප්‍රදායික තාල භාණ්ඩ ආශ්‍රිත නිර්මාණ දැක්විය හැකිය.

ජනශ්‍රැති ජනකලා අධ්‍යයනයේ දි ඒවා ගොඩනැගි ඇති සම්ප්‍රදාය සංස්කෘතික මූල පාරම්පරික උරුම නිර්මාණශිලි භාවිතය ආදිය පිළිබදව අවබෝධයක් ලබා ගත හැකිය. ජනශ්‍රැති සහ ජනකලා පිළිබද අවබෝධය දේශයට ගැලැපෙන නිර්මාණශිලි සන්නිවේදන සන්දේශයක් ගොඩනැගිම සදහා උපයෝගි කර ගත හැකිය. මෙහිලා දේශයේ සංස්කෘතිය පිළිබද අවබෝධය තිබිම වැදගත්වේ.

## නිර්මාණාත්මක සන්නිවේදන කාර්යයේ දී ජනශ්‍රැතිය හා ජනකලා භාවිතය.

යම්කිසි සන්දේශයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරිම සදහා ජනශ්‍රැති සහ ජනකලා උපයෝගි කර ගත හැකිය. ඉදිරිපත් කරන සන්දේශයේ විශ්වසනීයත්වය ගොඩනැගීම සදහා ජනශ්‍රැති සහ ජනකලා උපයෝගී කරගත හැකිය. යම් සමාජයකට ප්‍රජාවකට නව දැනුමක් ලබාදීමේදීත් ඔවුන් තුළ නව පුරුදු ඇති කිරීමේදීත් මෙම කලාවන් භාවිතයට ගත හැකිය. නිදසුනක් ලෙස ඩෙංගු රෝගය  සෑදෙන ආකාරය සහ එයින් ආරක්ෂා වීමට සිදු කළ යුතු කාර්යයන් පිළිබදව යම් ප්‍රජාවකට දැනුවත්භාවය ලබාදීම සදහා ජනශ්‍රැති අංග වන විදිනාට්‍ය කවි කොළය විරිදු යන කලාංග ඉවහල් කර ගත හැකිය.

<u>නිර්මාණශීලී සන්නිවේදනය කාර්යයේ දී ජනශ්‍රැති සහ ජනකලා උපයෝගී කර ගැනීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජන කිහිපයක් පහත දක්වා ඇත.</u>

1. ඵලදායී ලෙස සන්දේශයක් ඉදිරිපත් කළ හැකිය.
2. ග්‍රාහක ආකර්ෂණය වන ලෙස සන්දේශයක් ඉදිරිපත් කල හැකිය.
3. ජනශ්‍රැති සහ ජනකලා වලින් ඉදිරිපත් කරන සංකේත, සමාජ අවස්ථා, පහසුවෙන් අවබෝධ කරගත හැකිය.
4. සමාජ අත්දැකීම් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සදහා ජනශ්‍රැති අංග භාවිතා කළ හැකිය.
5. සංවර්ධන සන්දේශ ප්‍රබල ලෙස ජනගත කළ හැකිවීම.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**

- <u>ඵලදායී ලෙස සන්දේශයක් ඉදිරිපත් කළ හැකිය.</u>

ජනකවි ජනකතා ජන නාටක සහ ජනශ්‍රැති අංග ගොඩනැගී ඇත්තේ එම සමාජ වල ජීවත් වූ ජනයාගේ අත්දැකීම් පදනම් කොට ගෙනයි. නිදසුනක් පැල් කවියක් ගත හොත් එම කවිය තුළින් පැවැසෙන්නේ කෘෂිකර්මාන්තයේ දුෂ්කරතාවයන් සහ ගැමියා මුහුණදුන් ජීවන අත්දැකීම්ය. ජනකතා වන අන්දරේගේ කතාව මහදැනමුත්තාගේ කතාව වැනිකතා වලින්ද සමාජයේ විසූ පුද්ගලයන්ගේ මෝඩකම් මානය ආඩම්බරය වැනි ලක්ෂණ පිළිබඳව කියවේ. ජනශ්‍රැති අංග භාවිතය තුළින් නිර්මාණශීලීව සන්දේශයක් ගොඩනගා ගත හැකිය. විශේෂයෙන්ම යම් ප්‍රජාවකට යම් පණිවිඩයක් ලබා දී ඔවුන් තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමට මෙම ජනශ්‍රැතික අංග පහසුවෙන් භාවිතා කළ හැකිය. එමෙන්ම සාමූහික කටයුතු සඳහා පුද්ගලයන් තුළ පෙළඹවීමක් ඇති කිරීමට ඵලදායීව මෙම අංග භාවිතා කළ හැකිය.

- <u>ග්‍රාහක ආකර්ෂණය වන ලෙස සන්දේශයක් ඉදිරිපත් කල හැකිය.</u>

නිර්මාණාත්මක සන්නිවේදනයේ දී වැදගත් වන්නේ ඉලක්ක කර ගනු ලබන ග්‍රාහකයා ආකර්ෂණය වන ආකාරයෙන් සන්නිවේදනය කිරීමයි. විශේෂයෙන්ම ජනශ්‍රැති සහ ජනකලා ඇසුරු කිරීම මගින් කෙරෙන නිර්මාණ ජනවිඥානයට සමීප වේ. යම් පණිවිඩයක් ග්‍රාහකයන් වෙත ලබාදීමේ දී ජනශ්‍රැති සහ ජනකලාවන් වල අංග භාවිතයෙන් එය කවර හෝ සන්නිවේදන මාධ්‍යයක් උපයෝගී කොට ගෙන ඉදිරිපත්කලත් එහි ආකර්ශනීය ස්වභාවය ඉතාමත්මත් ඉහල මට්ටමක පවතී. නිදසුනක් ලෙස යම් වෙළඳ පණිවිඩයක් ජන කවියක් ඇසුරු කර ගනිමින් නිර්මාණය කොට පුවත් පතක පළ කළ හැකිය. එමෙන්ම යම් රෝගයකින් ආරක්ෂාවීම සඳහා ලබාදෙන උපදෙස් ශාන්තිකර්මයක් ආශ්‍රයෙන් ඉදිරිපත් කළ හැකිය. එමෙන්ම එය රූපවාහිනී මාධ්‍යයෙන් විකාශය කිරීම හරහා වඩා වැඩි ග්‍රාහක පිරිසක් ආකර්ශනය කර ගත හැකිය.

- <u>ජනශ්‍රැති සහ ජනකලාවලින් ඉදිරිපත් කරන සංකේත, සමාජ අවස්ථා, පහසුවෙන් අවබෝධ කරගත හැකිය.</u>

කෝලම් සොකරි දහඅට සන්නිය රූකඩ කලාව පාස්කු නාට්‍ය වැනි ජනශ්‍රැති වලට ඒවාට ආවේනික වූ ශෛලින් පවතී. සොකරි නාට්‍ය රගදක්වන්නේ කුඹුරු අස්වනු නෙලීමෙන් අනතුරුවයි. ඒවාට ආවේනික වූ කතා පුවතක් දක්නට ලැබේ. පාස්කු නාට්‍යයෙහි චරිත නිරූපනය සඳහා අවස්ථාව ලැබෙන්නේ පාරම්පරික උරුමයෙනි. ගමේ ප්‍රාජාව එහි රංග කාර්යයේ යෙදෙයි. කෝලම් නාට්‍ය විරෝධාකල්ප බහුල නාට්‍ය විශේෂයකි. එමෙන්ම මේවායේ එන පාත්‍රයෝ නාට්‍යමය අවස්ථා එම සමාජයට අතිශා සමීපය. මෙවැනි

ජනශ්‍රැති අංග නිර්මාණශීලීව අවස්ථානුකූලව යොදා ගැනීමෙන් ග්‍රාහකයන් ආකර්ශණය වන ලෙස සන්දේශයක් ඉදිරිපත් කළ හැකිය.

- **සමාජ අත්දැකීම් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සඳහා ජනශ්‍රැති අංග භාවිතා කළ හැකිය.**

කෝලම් නාට්‍ය විරෝධා කල්ප බහුල නාට්‍ය වර්ගයක් ලෙස හැඳින්විය හැකිය. එහි උපත ද විවිධ වත් පිළිවෙත් හා බැඳී පවතී. එහි මූලය ද්‍රවිඩ බලපෑමකින් පැවැත එන්නකි. වෙස් මුහුණු රංගනයද ජනප්‍රිය රංගන විශේෂයකි. මේවා බොහෝ විට හාස්‍යෝත්පාදක සන්නිවේදනය සඳහා යොදා ගනියි. සමාජයේ ජීවත්වන පුද්ගලයන්ගේ මෝඩකම් නොමනාකම් පිළිබඳව සමාජය දැනුවත් කිරිමේ සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් මෙවා භාවිතා කළ හැකිය. එමෙන්ම සමාජයේ ජීවත්වන සුවිශේෂී පුද්ගලයන්ගේ චරිතාපදාන මේවායින් ඉදිරිපත් කරයි.

- **සංවර්ධන සන්දේශ ප්‍රබල ලෙස ජනගත කළ හැකිවීම.**

ලෙඩරෝග පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට යම් යම් ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පුද්ගලයන් ඒ පිළිබඳව දැනුවත් කොට ඔවුන්ගේ සහය ලබා ගැනීමට ජනශ්‍රැති භාවිතා කළ හැකිය. එමෙන්ම සමාජය තුළ මුල් බැස ගෙන ඇති මිථ්‍යා විශ්වාස තුරන් කිරීම සඳහාත් මෙම අංග භාවිතා කළ හැකිය.

## නිර්මාණශීලී සන්නිවේදනය සඳහා ජනශ්‍රැති ජන කලා භාවිතා කර ඇති ආකාරය (සාකච්ඡාවක් ඇසුරින්).

**ජනශ්‍රැතිය ඇසුරින් අපේ සාහිත්‍යාංග සඳහා නිර්මාණාත්මක උපක්‍රම සොයා ගැනීම පිළිබඳව කතා කළොත්?**

අද සාහිත්‍ය පිළිබඳ අවධානය යොමු කරන කොට විශේෂයෙන් ම ජනතාව පුරාකතාව නව නිර්මාණ සඳහා ප්‍රබල ලෙස භාවිත කරගෙන තිබෙනවා.

දැනට බටහිර වඩාත් ජනප්‍රිය වෙලා තියෙන බැට්මැන්, (Bat man) සුපර්මැන් (Superman)වගේ චිත්‍රපටවලට පාදක වෙලා තියෙන්නේ පුරාකතා, ජනකතා වගේ අංශ. පසුගිය කාලේ ලංකාවට ආවා, ෂාරුක් ඛාන් රඟපාපු 'පහේලි' චිත්‍රපටය. ඒක හැදිලා තියෙන්නේ ජනකතාවකින්. මේක ඉතා රමණීය චිත්‍රපටයක් වෙන්න මේ පිටුපස තිබුණු ජනකතාව ප්‍රබල ලෙස බලපාලා තියෙනවා.

ඒ වගේ ම සත්‍යජිත් රායිගේ නිර්මාණ අරගත්තම ඒ නිර්මාණ බොහොමයක ජනකතාවෙන් ලබාගත් ආදර්ශ තිබුණා. ලතින් ඇමෙරිකානු රටවල මාකේස් වගේ අයගේ නිර්මාණවල මැජිකල් රියලිසම් ගන්නේ් ජනශ්‍රැතියේ එන පුරාකතා සහ පුරාවෘත්තවලින්.

මේ ජනකතාවල එන ජන වීරයන් බොහෝ වෙලාවට වර්තමාන නවකතාවල වීරයන් වගේ ම තමයි. ඒ මොඩල් එකයි අලුතින් යොදාගෙන නිර්මාණවලට අරගෙන තියෙන්නේ. ඇත්ත වශයෙන් ම කිසියම් නිර්මාණ සාහිත්‍යයක් දියුණුවෙන්න, පුරාවෘත්තවලින් ලැබිය හැකි ආභාසය, අනුග්‍රහය වැදගත්. මේ සඳහා ලෝකයේ බොහෝ රටවලින් නිදර්ශන පෙන්වලා දෙන්න පුළුවන්.

ලංකාවේ නිර්මාණ කරුවන් ජනශ්‍රැතියෙන් ලබන ආභාසය පිළිබඳව ඔබ දරන්නේ කෙබඳු අදහසක් ද?

ලංකාවේ ජනශ්‍රැතිය භාවිත කරමින් නිර්මාණය යෙදුණු නිර්මාණකරුවන් බොහොම අඩුවෙන් දකින්නට ඉන්නේ. සයිමන් නවගත්තේගම හැරුණාම අන් අයගේ නිර්මාණවල බොහොම කලාතුරකින් තමයි ජනශ්‍රැතිය පිළිබඳ අවධානය යොමුවුණේ.

අද දවසේ වුවත් ජයන්ත චන්ද්‍රසිරි වගේ කෙනෙකුගේ රූපවාහිනී සිනමා නිර්මාණවල හැරෙන්න පුරාකතාව, ජනකතාව පිළිබඳව අවධානයක් නැහැ. ජයන්තගේ අග්නිදාහය වගේ චිත්‍රපටයක, දඬුබස්නාමානය වගේ ටෙලිනාට්‍යයක කෙළින්ම ජනශ්‍රැතිය හා පුරාකතාව යොදා ගැනුණා.

ඒ නිර්මාණ දිහා බලපුවාම අපට ඒවායේ සැහෙන වෙනසක් පේනවා. ඇත්තෙන්ම ඒ පසු පස ශක්තිය ඇතිවෙලා තියෙන්නේ ජනශ්‍රැතිය නිසයි.

ඒ හැරුණාම ලංකාවේ ජනශ්‍රැතිය භාවිතා කළ නිර්මාණකරුවන් අඩුයි. කොහොම වුණත් ජනශ්‍රැතිය හරියාකාරව හැදෑරුවොත් එයින් ඉතාමත් විශිෂ්ට නිර්මාණ බිහිකරගන්න පුළුවන් වෙනවා.

**Udaya Amaraweera**
**BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**University Visiting Lecturer,**
**0711715342**